# ශ්‍රී ලංකාවේ ජාතික සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තිය

වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය

**1. ප්‍රතිපත්තියේ නම (Policy Name)**

ශ්‍රී ලංකා ජාතික සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තිය (National Maritime Transport Policy of Sri Lanka)

**2. බලාත්මක වන දිනය (Effective Date)**

මෙම ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු වහාම බලාත්මක වන අතර, එය ප්‍රතිස්ථාපනය කරන තෙක් හෝ අවලංගු කරන තෙක් වලංගු වේ. මෙම ප්‍රතිපත්තිය පහත සඳහන් පරිදි සමාලෝචනයට ලක් විය යුතුය:

- වාර්ෂිකව සහ සෑම වසර පහකට (05) වරක්ම අනිවාර්ය ඇගයීමක් සහ සමාලෝචනයක් සිදු කිරීම.
- ශ්‍රී ලංකාව පාර්ශවකරුවකු වන ජාත්‍යන්තර සම්මුතීන් සඳහා කිසියම් සංශෝධනයක් සම්මත කරගත් අවස්ථාවන්හිදී සිදු කෙරෙන අතුරු සමාලෝචන (Interim reviews).
- ජාතික අවශ්‍යතා හේතුවෙන් සිදු කිරීමට සිදුවන හදිසි යාවත්කාලීන කිරීම් (උදා: නාවික ආරක්ෂණ සිදුවීම්, වරාය ප්‍රතිසංස්කරණ, නියාමන ප්‍රතිව්‍යුහගත කිරීම්).

**3. හැඳින්වීම**

"නැගෙනහිර ආසියාව, අප්‍රිකාව, මැදපෙරදිග සහ යුරෝපය අතර ප්‍රධාන ගෝලීය නැව් මාර්ග සම්බන්ධ කරමින්, ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ උපායමාර්ගික සන්ධිස්ථානයක පිහිටා ඇත. වාර්ෂිකව ශ්‍රී ලංකාවට දකුණින් පිහිටි මුහුදු මාර්ග ඔස්සේ නෞකා 60,000 කට අධික සංඛ්‍යාවක් යාත්‍රා කරන බැවින්, ආර්ථික සංවර්ධනය, ජාතික ආරක්ෂාව සහ ගෝලීය සබැඳියාවන් උදෙසා සමුද්‍රීය වෙළඳාම, සේවා සැපයුම් (Logistics) සහ සාගර සම්පත් උපයෝගී කර ගැනීමට හැකිවන පරිදි ශ්‍රී ලංකාව සුවිශේෂී ලෙස ස්ථානගත වී ඇත.

මෙම උපායමාර්ගික වාසිය පැවතියද, ඉතිහාසය පුරාම සමුද්‍රීය ක්ෂේත්‍රය පාලනය වී ඇත්තේ විසිරුණු ප්‍රතිපත්ති, ඛණ්ඩනය වූ ආයතනික බලතල සහ අංශවලට පමණක් සීමා වූ උපායමාර්ග මගිනි. මෙම අඩුවාඩුව මඟහරවා ගැනීම සඳහා, ජාතික සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තිය මගින් පවතින රාමු ඒකාබද්ධ කරන අතර, පහත සඳහන් කරුණු ද ඊට ඇතුළත් කරනු ලබයි:

- පෙර පැවති ජාතික සමුද්‍රීය උපායමාර්ගවලින් උගත් පාඩම්
- ජාතික සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්ති (NMP) කෙටුම්පත්වල සම්පූර්ණ විෂය පථය
- ශ්‍රී ලංකා නව සමුද්‍රීය අධිකාරිය (MASL) යටතේ මතුවන ආයතනික බලතල
- ජාත්‍යන්තර සමුද්‍රීය බැඳීම් (IMO, ILO, UN, UNCTAD, UNEP, IALA, IHO ආදිය)
- ඉදිරි දශකය තුළ සම්බන්ධීකරණය කරන ලද සමුද්‍රීය සංවර්ධනයක අවශ්‍යතාවය

එබැවින්, මෙම ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ එකම, නිල සහ අනාගතයට ගැළපෙන ජාතික සමුද්‍රීය රාමුව ලෙස ක්‍රියා කරයි.

## I. පසුබිම

ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ සමුද්‍රීය ක්ෂේත්‍රය ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන අතර, ජාත්‍යන්තර වෙළඳාම සහ වාණිජ්‍යය සඳහා වැදගත් ද්වාරයක් ලෙසද ක්‍රියා කරයි. මෑත වසරවලදී, ශ්‍රී ලංකාව සිය උපායමාර්ගික භූගෝලීය පිහිටීමෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට සහ ආර්ථික වර්ධනය ශක්තිමත් කිරීම සඳහා තම සමුද්‍රීය සේවා සැපයුම් (Logistics) ප්‍රශස්ත කිරීමේ වැදගත්කම හඳුනාගෙන ඇත. තනි "ජාතික සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තියක්" නොතිබුණද, වරාය යටිතල පහසුකම් නැංවීමට, වෙළඳ ක්‍රියාවලීන් විධිමත් කිරීමට මෙන්ම සමුද්‍රීය මෙහෙයුම්වල කාර්යක්ෂමතාව සහ තිරසාරභාවය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාව විවිධ මුලපිරීම් සහ උපායමාර්ග රාශියක් ක්‍රියාවට නංවා ඇත. මෙම හැඳින්වීම මගින් ශ්‍රී ලංකාව සමුද්‍රීය සේවා සැපයුම් ක්ෂේත්‍රය තුළ සිදුකරන ප්‍රයත්නයන් සහ කලාපීය සමුද්‍රීය කේන්ද්‍රස්ථානයක් ලෙස තම ස්ථාවරය ශක්තිමත් කරගැනීම සඳහා ගෙන ඇති විවිධ ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග පිළිබඳව ගවේෂණය කිරීමට මඟ පාදයි.

## II. අවශ්‍යතාවය

ඉන්දියන් සාගරයේ ශ්‍රී ලංකාව පිහිටා ඇති උපායමාර්ගික පිහිටීම, ජාත්‍යන්තර වෙළඳාම පහසු කිරීමට සහ ආර්ථික වර්ධනය ඉදිරියට ගෙන යාමට සමුද්‍රීය ක්ෂේත්‍රය සතු වැදගත්කම මැනවින් කියා පායි. මෙම විභවතාවයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාව "ජාතික සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තියක්" හඳුන්වා දෙමින් සිටී. මෙම ප්‍රතිපත්තියේ අරමුණ වන්නේ සමුද්‍රීය යටිතල පහසුකම්, සේවාවන් සහ රෙගුලාසි ප්‍රශස්ත කිරීම සඳහා පුළුල් හා විධිමත් රාමුවක් සැපයීමයි.

### ප්‍රධාන අරමුණු (Key Objectives)

I. **යටිතල පහසුකම් සංවර්ධනය (Infrastructure Development):** වර්ධනය වන වෙළඳ පරිමාවන් සහ විශාල ප්‍රමාණයේ නෞකා සඳහා ඉඩකඩ සැලසීමට වරාය පහසුකම් ඉහළ නැංවීම.

II. **නියාමන රාමුව (Regulatory Framework):** සමුද්‍රීය ක්ෂේත්‍රයේ නියාමන අවකාශය ඒකාබද්ධ කර තාර්කික කළ යුතුය. වෙළඳ නැව් ලේකම් කාර්යාලය (MSS) වෙනුවට ශ්‍රී ලංකා සමුද්‍රීය අධිකාරිය (MASL) පිහිටුවීම මඟින් දිගුකාලීනව පැවති පාලන බණ්ඩනය වීම් විසඳා ගත හැකි අතර, සමුද්‍රීය ආරක්ෂාව, සුරක්ෂිතතාව සහ පාරිසරික ආරක්ෂණය සඳහා පැහැදිලි රෙගුලාසි ස්ථාපිත කෙරේ.

III. **බහුමාධ්‍ය ප්‍රවාහන සබැඳියාව (Multimodal Connectivity):** සමස්ත සේවා සැපයුම්වල (Logistics) කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා සමුද්‍රීය ප්‍රවාහනය අනෙකුත් ප්‍රවාහන මාධ්‍ය සමඟ ඒකාබද්ධ කිරීම.

IV. **වෙළඳ පහසුකම් සැලසීම (Trade Facilitation):** පිරිවැය සහ ප්‍රවාහන කාලය අවම කිරීම සඳහා රේගු ක්‍රියාපටිපාටි සහ ලේඛනගත කිරීම් සරල කිරීම.

V. **සමුද්‍රීය මානව සම්පත් (Marine Human Resources):** සමුද්‍රීය මානව සම්පත් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, ප්‍රමිතිකරණය සහ ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති රාමුවක් ස්ථාපිත කිරීම.

VI. **ධාරිතා වර්ධනය (Capacity Building):** ක්ෂේත්‍රයේ ඉල්ලුමට සපුරාලීම සඳහා ශ්‍රම බලකාය සංවර්ධනය කිරීම සහ නිපුණතා පුහුණුව වෙනුවෙන් ආයෝජනය කිරීම.

VII. **තාක්ෂණය වැළඳ ගැනීම (Technology Adoption):** මෙහෙයුම් ප්‍රශස්ත කිරීම සහ අවදානම් අවම කිරීම සඳහා ඩිජිටල්කරණය සහ ස්වයංක්‍රීයකරණය (Automation) උපයෝගී කර ගැනීම.

VIII. **පාරිසරික තිරසාරභාවය (Environmental Sustainability):** සමුද්‍රීය ක්ෂේත්‍රයෙන් පරිසරයට සිදුවන බලපෑම අවම කිරීම සඳහා පරිසර හිතකාමී ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම.

IX. **සමුද්‍රීය සේවාවන් (Maritime Services):** සමුද්‍රීය ආර්ථිකය විවිධාංගීකරණය කිරීමට සහ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා අතිරේක/අනුබද්ධ සේවාවන් ප්‍රවර්ධනය කිරීම.

X. **අනුකූලතාවය (Compliance):** ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානයේ (IMO) සම්මුතීන්ට සහ ශ්‍රී ලංකාව පාර්ශවකරුවෙකු වන සමුද්‍රීය කර්මාන්තයට අදාළ අනෙකුත් ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූල වීම සඳහා අවශ්‍ය ක්‍රියාපටිපාටි සහ නීතිමය රාමුව සංවර්ධනය කිරීම.

XI. **නෞකා වාර්තාකරණය (Ship Reporting):** නාවික ගමනාගමනයේ ආරක්ෂාව, කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ සාගර පරිසරය ආරක්ෂා කිරීම සඳහා, IMO හි "නැව් මාර්ගගත කිරීමේ" (Ships' Routing) මාර්ගෝපදේශයේ මූලධර්ම සහ ක්‍රියාමාර්ග සමඟ සමගාමීව ක්‍රියා කරන නෞකා කළමනාකරණ පද්ධතියක් (VMS) සංවර්ධනය කිරීම.

මෙම මූලපිරීම් හරහා, ශ්‍රී ලංකාව නවෝත්පාදනයන් දිරිමත් කරමින් සහ තිරසාර ආර්ථික සංවර්ධනයක් කරා යමින්, කලාපීය සමුද්‍රීය කේන්ද්‍රස්ථානයක් ලෙස ස්ථාපිත වීමට අරමුණු කරයි.

### III. අරමුණ සහ සන්දර්භය (Purpose & Context)

වැදගත් සමුද්‍රීය සන්ධිස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව පිහිටා ඇති භූගෝලීය පිහිටීම, රට සතු සමුද්‍රීය විභවතාවන් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා උපායමාර්ගික ප්‍රවේශයක අවශ්‍යතාවය මතු කරයි. මෙම පසුබිම තුළ, ජාතික සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තිය හඳුන්වා දෙනු ලබන්නේ ද්විත්ව අරමුණක් ඇතිවය: එනම් ශ්‍රී ලංකාවේ සමුද්‍රීය සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම සහ කලාපීය මෙන්ම ගෝලීය වෙළඳාමේ ප්‍රධාන කොටස්කරුවෙකු ලෙස ශ්‍රී ලංකාවේ ස්ථානය තවදුරටත් ශක්තිමත් කර ගැනීම.

**අරමුණ (Purpose):**

I. **සමුද්‍රීය සම්පත් ප්‍රශස්ත කිරීම (Optimization of Maritime Resources):** මෙම ප්‍රතිපත්තිය මඟින් ශ්‍රී ලංකාවේ සමුද්‍රීය යටිතල පහසුකම්, සමුද්‍රීය මානව සම්පත්, සේවාවන් සහ නියාමන රාමු විධිමත් කිරීම සහ නවීකරණය කිරීම අරමුණු කරයි. එමඟින් සමුද්‍රීය සේවා සැපයුම් (Logistics) ක්ෂේත්‍රය පුරා කාර්යක්ෂමතාව, විශ්වාසනීයත්වය සහ තිරසාරභාවය ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

II. **වෙළඳ තරඟකාරිත්වය ඉහළ නැංවීම (Enhancement of Trade Competitiveness):** සමුද්‍රීය වෙළඳාම සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම මඟින් ගෝලීය වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ තරඟකාරිත්වය ඉහළ නැංවීමට මෙම ප්‍රතිපත්තිය උත්සාහ කරයි. සබැඳියාවන් (Connectivity) වැඩි දියුණු කිරීම, වෙළඳ බාධක අවම කිරීම සහ වඩාත් සුමට සැපයුම් දාම මෙහෙයුම් සඳහා පහසුකම් සැලසීම මීට ඇතුළත් වේ.

**සන්දර්භය (Context):**

I. **උපායමාර්ගික භූ-දේශපාලනික පිහිටීම (Strategic Geopolitical Position):** ප්‍රධාන ජාත්‍යන්තර නැව් මාර්ගවල කේන්ද්‍රස්ථානයක පිහිටා ඇති බැවින්, ශ්‍රී ලංකාවේ සමුද්‍රීය වැදගත්කම එහි දේශසීමාවලින් ඔබ්බට විහිද යයි. මෙම ප්‍රතිපත්තිය සකස් කර ඇත්තේ එම උපායමාර්ගික වාසියෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට සහ කලාපීය මෙන්ම ගෝලීය සමුද්‍රීය වෙළඳාමේ වැදගත් කොටස්කරුවෙකු ලෙස රට ස්ථානගත කිරීමටය.

II. **ආර්ථික අවශ්‍යතාවන් (Economic Imperatives):** සමුද්‍රීය වෙළඳාම ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන මුල්ගලක් වන බැවින්, සමුද්‍රීය සැපයුම් දාම යටිතල පහසුකම් නවීකරණය හා ප්‍රශස්ත කිරීමේ දැඩි අවශ්‍යතාවයක් පවතී. මෙම ප්‍රතිපත්තිය සැලසුම් කර ඇත්තේ එම අවශ්‍යතාවලට විසඳුම් සෙවීමට සහ සමුද්‍රීය ක්ෂේත්‍රයේ පූර්ණ ආර්ථික විභවය මුදා හැරීමටය.

III. **ගෝලීය ප්‍රවණතා සහ හොඳම භාවිතයන් (Global Trends and Best Practices):** වඩ වඩාත් අන්තර්-සම්බන්ධිත සහ තාක්ෂණය මත පදනම් වන ලෝකයක, මෙම ප්‍රතිපත්තිය ගෝලීය හොඳම භාවිතයන් සහ සමුද්‍රීය සැපයුම් දාම ක්ෂේත්‍රයේ නැගී එන ප්‍රවණතාවලින් ආභාසය ලබා ඇත. ගෝලීය මට්ටමින් එහි අදාළත්වය සහ තරඟකාරිත්වය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාවේ උපායමාර්ග ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල කිරීමට මෙය උත්සාහ කරයි.

ජාතික සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තියේ අරමුණ සහ පසුබිම පැහැදිලි කිරීම තුළින්, වඩාත් කාර්යක්ෂම, තිරසාර සහ ගෝලීය වශයෙන් ඒකාබද්ධ වූ සමුද්‍රීය පරිසර පද්ධතියක් කරා යන පරිවර්තනීය ගමනක් ආරම්භ කිරීමට ශ්‍රී ලංකාව අපේක්ෂා කරයි.

**IV. තාර්කික පදනම (Rationale)**

ශ්‍රී ලංකාවේ ජාතික සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තිය හඳුන්වා දීම සඳහා අභ්‍යන්තර අවශ්‍යතා මෙන්ම බාහිර අවස්ථා ද පිළිබිඹු කරන ප්‍රබල තාර්කික පදනම් කිහිපයක් උපකාරී වී ඇත:

I. **ආර්ථික වර්ධනය (Economic Growth):** ශ්‍රී ලංකාවේ ආර්ථිකය සමුද්‍රීය වෙළඳාම සමඟ සංකීර්ණ ලෙස බැඳී පවතින අතර, වරායන් ආනයන හා අපනයන සඳහා අත්‍යවශ්‍ය ද්වාර ලෙස ක්‍රියා කරයි. සමුද්‍රීය සේවා සැපයුම් (Logistics) ප්‍රශස්ත කිරීම මඟින් වඩාත් සුමට වෙළඳ ගලනයක් ඇති කිරීම, ආයෝජන ආකර්ෂණය කර ගැනීම සහ රැකියා අවස්ථා නිර්මාණය කිරීම මඟින් ආර්ථික වර්ධනය උත්ප්‍රේරණය කිරීම මෙම ප්‍රතිපත්තියේ අරමුණයි.

II. **සමුද්‍රීය මානව සම්පත් (Marine Human Resources):** ශ්‍රී ලංකාවේ සමුද්‍රීය කර්මාන්තයේ ප්‍රගතිය සඳහා සමුද්‍රීය මානව සම්පත් වඩාත්ම වටිනා සහ උපායමාර්ගික වත්කම ලෙස හඳුනාගෙන ඇත. ශ්‍රී ලාංකික නාවිකයන් වසර ගණනාවක් පුරා ජාත්‍යන්තර මුහුදු වෙළඳාම, ගෝලීය ආර්ථිකය සහ පොදුවේ සමාජය තුළ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කර ඇත. සමුද්‍රීය මානව සම්පත් කළමනාකරණය යනු අධ්‍යාපනය, පුහුණුව, රැකියා නියුක්තිය සහ තිරසාර සංවර්ධනය වැනි විවිධ අංශ ආමන්ත්‍රණය කරන බහුවිධ ප්‍රවේශයකි.

III. **තරඟකාරී වාසිය (Competitive Advantage):** වඩ වඩාත් තරඟකාරී වන ගෝලීය වෙළඳපොළක් තුළ, ප්‍රධාන නැව් මාර්ග ආශ්‍රිතව පිහිටි සිය උපායමාර්ගික පිහිටීමෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට ශ්‍රී ලංකාව උත්සාහ කරයි. වරාය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, සැපයුම් දාම පිරිවැය අඩු කිරීම සහ නැව් සමාගම් මෙන්ම වෙළඳුන් වෙත කාර්යක්ෂම සේවාවන් සැපයීම මඟින් රටේ තරඟකාරී වාසිය ඉහළ නැංවීම මෙම ප්‍රතිපත්තියේ අරමුණයි.

IV. **යටිතල පහසුකම් නවීකරණය (Infrastructure Modernization):** විශාල ප්‍රමාණයේ නෞකා සඳහා ඉඩකඩ සැලසීමට, දිනෙන් දින වර්ධනය වන භාණ්ඩ පරිමාවන් හැසිරවීමට සහ ක්ෂේත්‍රයේ දියුණු වන ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා ශ්‍රී ලංකාවේ සමුද්‍රීය යටිතල පහසුකම් නවීකරණය කිරීම අවශ්‍ය වේ. මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ ධාරිතාව ඉහළ නැංවීම සඳහා වරාය පහසුකම්, පර්යන්ත (Terminals) සහ ආධාරක යටිතල පහසුකම් සඳහා කෙරෙන ආයෝජනවලට මෙම ප්‍රතිපත්තිය ප්‍රමුඛතාවය දෙයි.

V. **වෙළඳ පහසුකම් සැලසීම (Trade Facilitation):** සංකීර්ණ රේගු ක්‍රියාපටිපාටි, නිලධාරීවාදී බාධා සහ අකාර්යක්ෂම සේවා සැපයුම් ක්‍රියාවලීන් බොහෝ විට වෙළඳ තරඟකාරිත්වයට බාධා පමුණුවයි. භාණ්ඩ ප්‍රවාහනය වඩාත් සුමට කිරීමට සහ ගනුදෙනු පිරිවැය අවම කිරීම සඳහා වෙළඳ ක්‍රියාපටිපාටි විධිමත් කිරීම, පරිපාලනමය බර අඩු කිරීම සහ සැපයුම් දාමයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම මෙම ප්‍රතිපත්තියේ අරමුණයි.

VI. **කලාපීය ඒකාබද්ධතාව (Regional Integration):** ශ්‍රී ලංකාවේ උපායමාර්ගික පිහිටීම, දකුණු ආසියාවේ ද්වාරයක් ලෙස සහ කලාපීය වෙළඳාම මෙන්ම සබැඳියාවන් සඳහා විභව කේන්ද්‍රස්ථානයක් ලෙස ස්ථානගත කරයි. සමුද්‍රීය සබැඳියාවන් වැඩි දියුණු කිරීම, වෙළඳ සබඳතා ප්‍රවර්ධනය කිරීම සහ වරාය සංවර්ධන මුලපිරීම් සම්බන්ධයෙන් අසල්වැසි රටවල් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම මඟින් කලාපීය ඒකාබද්ධතාවය ඉහළ නැංවීමට මෙම ප්‍රතිපත්තිය උත්සාහ කරයි.

VII. **තිරසාරභාවය සහ ඔරොත්තු දීමේ හැකියාව (Sustainability and Resilience):** දේශගුණික විපර්යාස, පාරිසරික හායනය සහ ස්වභාවික විපත් සමුද්‍රීය මෙහෙයුම් සහ යටිතල පහසුකම් සඳහා සැලකිය යුතු අවදානමක් මතු කරයි. පරිසර හිතකාමී භාවිතයන්, ආපදා සූදානම සහ යටිතල පහසුකම්වල ඔරොත්තු දීමේ හැකියාව නැංවීම ඇතුළුව මෙම අවදානම් අවම කිරීම සඳහා වන තිරසාර සහ ඔරොත්තු දීමේ ක්‍රියාමාර්ග පිළිබඳව මෙම ප්‍රතිපත්තිය අවධාරණය කරයි.

VIII. **තාක්ෂණ අනුගතවීම (Technology Adoption):** ඩිජිටල්කරණය, ස්වයංක්‍රීයකරණය (Automation) සහ දත්ත විශ්ලේෂණය (Data Analytics) යන ක්ෂේත්‍රවල ශීඝ්‍ර දියුණුව සමුද්‍රීය කර්මාන්තය සඳහා පරිවර්තනීය අවස්ථාවන් සලසා දෙයි. වරාය මෙහෙයුම් ප්‍රශස්ත කිරීමට, සැපයුම් දාමයේ විනිවිදභාවය ඉහළ නැංවීමට සහ තීරණ ගැනීමේ ක්‍රියාවලීන් වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණයට අනුගතවීම මෙම ප්‍රතිපත්තිය මඟින් දිරිමත් කරයි.

IX. **ප්‍රතිපත්ති සම්බන්ධීකරණය සහ පාලනය (Policy Coordination and Governance):** ඛණ්ඩනය වූ නියාමන රාමු සහ ආයතනික අකාර්යක්ෂමතාවන් බොහෝ විට සමුද්‍රීය ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සහ සම්බන්ධීකරණයට බාධා කරයි. ඵලදායී ලෙස ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා පාලන ව්‍යුහයන් ඉහළ නැංවීම, ආයතන අතර සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සහ පැහැදිලි වගවීමේ යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම මෙම ප්‍රතිපත්තිය මඟින් අරමුණු කරයි.

මෙම තාර්කික පදනම් ආමන්ත්‍රණය කිරීම මඟින්, ශ්‍රී ලංකාවේ ජාතික සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තිය රටේ සමුද්‍රීය ක්ෂේත්‍රයේ පූර්ණ විභවය මුදා හැරීමටත්, එමඟින් ආර්ථික වර්ධනය වේගවත් කිරීමටත්, වෙළඳ තරඟකාරිත්වය ඉහළ නැංවීමටත්, තිරසාර සංවර්ධනයක් ඇති කිරීමටත් අපේක්ෂා කරයි.

### V. දැක්ම (Vision)

"ආර්ථික සන්නිවේදනය හා සමෘද්ධිය, පාරිසරික භාරකාරත්වය මෙන්ම සියලු පුරවැසියන් සඳහා ඇතුළත් කරගත් (සර්වභාගී) අවස්ථා උදාකර දෙමින්, ශ්‍රී ලංකාව ගෝලීය වශයෙන් තරඟකාරී, සුරක්ෂිත, ආරක්ෂිත, තිරසාර සහ තාක්ෂණික වශයෙන් දියුණු ඉන්දියන් සාගර සමුද්‍රීය කේන්ද්‍රස්ථානයක් ලෙස ස්ථානගත කිරීම."

### VI. මෙහෙවර (Mission)

"ශ්‍රී ලංකා සමුද්‍රීය අධිකාරිය (MASL) විසින් මෙහෙයවනු ලබන සහ ජාතික මෙන්ම ගෝලීය සහයෝගිතා හවුල්කාරිත්වයන්ගේ සහය ලබන ඒකාබද්ධ, විනිවිදභාවයෙන් යුත් සහ ජාත්‍යන්තරයට අනුකූල නියාමන රාමුවක් හරහා සමුද්‍රීය පාලනය ශක්තිමත් කිරීම, යටිතල පහසුකම් නවීකරණය කිරීම, මානව ප්‍රාග්ධනය නැංවීම, විවිධ ජාත්‍යන්තර සම්මුතීන් යටතේ ඇති බැඳීම් ඉටු කිරීම සහ නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීම."

## 4. ප්‍රතිපත්ති මූලධර්ම (Policy Principles)

ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තිය මෙහෙයවනු ලබන්නේ එහි උපායමාර්ගික අරමුණු සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම් සඳහා පදනම වන මූලික මූලධර්ම සමුදායක් මඟිනි. මෙම මූලධර්ම මඟින් තිරසාර ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම, වෙළඳ පහසුකම් සැලසීම, ආරක්ෂාව සහ සුරක්ෂිතතාව තහවුරු කිරීම, පාරිසරික තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීම, ජාත්‍යන්තර සහයෝගීතාව වර්ධනය කිරීම සහ සමුද්‍රීය ක්‍රියාකාරකම් සඳහා හිතකර නියාමන රාමුවක් සැපයීම වෙනුවෙන් රට සතු කැපවීම පිළිබිඹු කරයි. ප්‍රධාන ප්‍රතිපත්ති මූලධර්ම පහත පරිදි වේ:

I. **තිරසාර සංවර්ධනය (Sustainable Development):** ආර්ථික වර්ධනය, පාරිසරික සංරක්ෂණය සහ සමාජීය වගකීම අතර සමතුලිතතාවයක් පවත්වා ගනිමින් සිය සමුද්‍රීය ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීමට ශ්‍රී ලංකාව කැපවී සිටී. දිගුකාලීන තිරසාරභාවයට අනුබල දෙන, පාරිසරික බලපෑම් අවම කරන සහ සමුද්‍රීය පරිසර පද්ධතිවල ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නංවන ආයෝජන සහ මුලපිරීම් සඳහා මෙම ප්‍රතිපත්ති මඟින් ප්‍රමුඛතාවය දෙනු ලබයි.

II. **වෙළඳ පහසුකම් සැලසීම (Trade Facilitation):** වෙළඳ ක්‍රියාවලීන් විධිමත් කිරීම, නිලධාරිවාදී බාධා අවම කිරීම සහ සමුද්‍රීය සේවා සැපයුම්වල (Logistics) කාර්යක්ෂමතාව නැංවීම අරමුණු කරගනිමින්, ශ්‍රී ලංකාව සිය සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තිය තුළ වෙළඳ පහසුකම් සැලසීමේ වැදගත්කම අවධාරණය කරයි.

භාණ්ඩ හා සේවාවල වඩාත් සුමට සංචලනයක් සඳහා පහසුකම් සැලසීමට වරාය මෙහෙයුම් ප්‍රශස්ත කිරීම, රේගු ක්‍රියාපටිපාටි වැඩි දියුණු කිරීම සහ සබැඳියාවන් (Connectivity) ඉහළ නැංවීම කෙරෙහි ප්‍රතිපත්ති අවධානය යොමු කරයි.

III. **ආරක්ෂාව සහ සුරක්ෂිතතාව (Safety and Security):** මුහුදු කොල්ලකෑම්, ත්‍රස්තවාදය සහ සමුද්‍රීය අනතුරු වැනි තර්ජනවලින් සමුද්‍රීය ක්‍රියාකාරකම් ආරක්ෂා කරගැනීමේ වැදගත්කම හඳුනාගනිමින්, ශ්‍රී ලංකාව සිය සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තිය තුළ ආරක්ෂාව සහ සුරක්ෂිතතාවයට ප්‍රමුඛත්වය දෙයි. සමුද්‍රීය මෙහෙයුම්වල ආරක්ෂාව සහ සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා ආරක්ෂණ ක්‍රියාමාර්ග, සමුද්‍රීය ආරක්ෂක ධාරිතාවන් ඉහළ නැංවීම, නියාමන රාමු ශක්තිමත් කිරීම සහ ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම මීට ඇතුළත් වේ.

IV. **පාරිසරික තිරසාරභාවය (Environmental Sustainability):** පාරිසරික තිරසාරභාවය යනු ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තියේ ප්‍රධාන කුළුණකි. මෙහි ප්‍රතිපත්ති සකස් කර ඇත්තේ පරිසර හිතකාමී නැව්ගත කිරීමේ භාවිතයන් ප්‍රවර්ධනය කිරීමට, විමෝචනය (Emissions) අවම කිරීමට සහ වරාය මෙන්ම වෙරළබඩ ප්‍රදේශවල දූෂණය අවම කිරීමටය. සමුද්‍රීය ක්‍රියාකාරකම්වලින් පරිසරයට සිදුවන බලපෑම අවම කිරීම සඳහා හරිත තාක්ෂණයන් වැළඳ ගැනීමට, දූෂණය වැළැක්වීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට සහ සාගර ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීමට ශ්‍රී ලංකාව කැපවී සිටී.

V. **ජාත්‍යන්තර සහයෝගීතාව (International Collaboration):** අසල්වැසි රටවල්, කලාපීය සංවිධාන සහ ජාත්‍යන්තර පාර්ශවකරුවන් සමඟ පවතින හවුල්කාරිත්වයේ වැදගත්කම හඳුනාගනිමින්, ශ්‍රී ලංකාව සිය සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තිය තුළ ජාත්‍යන්තර සහයෝගීතාව අගය කරයි. පොදු සමුද්‍රීය අභියෝගවලට විසඳුම් සෙවීම, සමුද්‍රීය සබැඳියාවන් ඉහළ නැංවීම සහ අන්‍යෝන්‍ය සමෘද්ධිය ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම ප්‍රතිපත්ති මඟින් සංවාද, තොරතුරු හුවමාරුව සහ ඒකාබද්ධ මූලපිරීම් දිරිමත් කරනු ලබයි.

VI. **නියාමන රාමුව (Regulatory Framework):** යහපාලනය, වගවීම සහ නීතිමය නිශ්චිතභාවය පිළිබඳ මූලධර්ම මඟින් මෙහෙයවනු ලබන, සමුද්‍රීය ක්‍රියාකාරකම් සඳහා විනිවිදභාවයෙන් යුත්, පුරෝකථනය කළ හැකි සහ හිතකර නියාමන රාමුවක් ශ්‍රී ලංකාව පවත්වාගෙන යයි. සමුද්‍රීය මෙහෙයුම් ක්‍රමවත්ව පවත්වාගෙන යාම සහතික කිරීම සහ පාර්ශවකරුවන් සඳහා සමාන අවස්ථා සහිත පරිසරයක් (Level playing field) නිර්මාණය කිරීම සඳහා පැහැදිලි රෙගුලාසි, ප්‍රමිති සහ අනුකූලතා අවශ්‍යතා ස්ථාපිත කිරීම මෙහි අරමුණයි.

VII. **ඇතුළත් කරගත් (සර්වභාගී) වර්ධනය (Inclusive Growth):** සමුද්‍රීය ක්‍රියාකාරකම්වල ප්‍රතිලාභ සමාජය පුරා සාධාරණ ලෙස බෙදී යන බව සහතික කරමින්, සර්වභාගී වර්ධනය සහ සමාජ-ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තිය කැපවී සිටී. රැකියා අවස්ථා නිර්මාණය කිරීම, ජීවනෝපායන් සුරැකීම සහ සැමට ප්‍රතිලාභ ලැබෙන සමෘද්ධියක් ඇති කිරීම සඳහා මානව ප්‍රාග්ධනය, නිපුණතා සංවර්ධනය සහ යටිතල පහසුකම් සඳහා කෙරෙන ආයෝජනවලට ප්‍රමුඛත්වය දීම මෙහි ප්‍රතිපත්ති මඟින් අපේක්ෂා කෙරේ.

මෙම ප්‍රතිපත්ති මූලධර්ම සමුද්‍රීය සංවර්ධනය පිළිබඳ ශ්‍රී ලංකාවේ උපායමාර්ගික ප්‍රවේශයට මඟ පෙන්වන අතර, සමුද්‍රීය ක්ෂේත්‍රය තුළ එහි ප්‍රමුඛතා, ක්‍රියාවන් සහ මැදිහත්වීම් හැඩගස්වයි. මෙම මූලධර්ම ආරක්ෂා

කිරීම මඟින් තිරසාර සංවර්ධනය සහ සමෘද්ධිය උදෙසා සිය සමුද්‍රීය ක්ෂේත්‍රයේ පූර්ණ විභවය ප්‍රයෝජනයට ගැනීමට ශ්‍රී ලංකාව අරමුණු කරයි.

## 5. ප්‍රතිපත්ති ප්‍රකාශන (Policy Statements)

I. **ආර්ථික සංවර්ධනය (Economic Development):** ආර්ථික සංවර්ධනය සහ සමෘද්ධිය ළඟා කර ගැනීම සඳහා සිය සමුද්‍රීය වත්කම් උපයෝගී කර ගැනීමට ශ්‍රී ලංකාව කැපවී සිටී. දළ දේශීය නිෂ්පාදනය (GDP) වර්ධනයට සහ රැකියා උත්පාදනයට සමුද්‍රීය ක්ෂේත්‍රයෙන් ලැබෙන දායකත්වය උපරිම කිරීම සඳහා ආයෝජන ආකර්ෂණය කර ගැනීම, වෙළඳාම ප්‍රවර්ධනය කිරීම සහ අපගේ සමුද්‍රීය ක්ෂේත්‍රයේ තරඟකාරිත්වය ඉහළ නැංවීම කෙරෙහි අපගේ ප්‍රතිපත්ති අවධානය යොමු කරනු ඇත.

II. **වෙළඳ පහසුකම් සැලසීම (Trade Facilitation):** ආර්ථික වර්ධනය සහ තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීමේදී කාර්යක්ෂම වෙළඳ පහසුකම් සැලසීමේ වැදගත්කම අපි හඳුනා ගනිමු. අපගේ වරායන් හරහා භාණ්ඩ හා සේවාවල වඩාත් සුමට සංචලනයක් සඳහා පහසුකම් සැලසීමට රේගු ක්‍රියාපටිපාටි විධිමත් කිරීම, නිශ්කාශන කාලය (Clearance times) අවම කිරීම සහ සබැඳියාවන් (Connectivity) වැඩි දියුණු කිරීම කෙරෙහි අපගේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවය දෙනු ඇත.

III. **යටිතල පහසුකම් සංවර්ධනය (Infrastructure Development):** වර්ධනය වන වෙළඳ පරිමාවන්ට ඉඩ සැලසීමට සහ කලාපීය මෙන්ම ගෝලීය වෙළඳපොළවල් සමඟ පවතින සබැඳියාවන් ඉහළ නැංවීම සඳහා සිය වරාය යටිතල පහසුකම් නවීකරණය කිරීමට සහ පුළුල් කිරීමට ශ්‍රී ලංකාව කැපවී සිටී. තිරසාර ආර්ථික වර්ධනයකට අනුබල දීම සඳහා වරාය පහසුකම් වෙනුවෙන් ආයෝජනය කිරීම, ප්‍රවාහන ජාලයන් නවීකරණය කිරීම සහ අභ්‍යන්තර ගොඩබිම් සබැඳියාවන් (Hinterland connectivity) ඉහළ නැංවීම කෙරෙහි අපගේ ප්‍රතිපත්ති අවධානය යොමු කරනු ඇත.

IV. **ආරක්ෂාව සහ සුරක්ෂිතතාව (Safety and Security):** සමුද්‍රීය ක්‍රියාකාරකම්වල ආරක්ෂාව සහ සුරක්ෂිතතාව සහතික කිරීම ශ්‍රී ලංකාවේ ඉහළම ප්‍රමුඛතාවයකි. අපගේ සමුද්‍රීය අවශ්‍යතා සුරැකීමට සහ ජාතික ආරක්ෂාව ආරක්ෂා කිරීම සඳහා සමුද්‍රීය ආරක්ෂක ධාරිතාවන් ශක්තිමත් කිරීම, නිරීක්ෂණ සහ අධීක්ෂණ පද්ධති ඉහළ නැංවීම මෙන්ම මුහුදු කොල්ලකෑම්, ත්‍රස්තවාදය සහ සමුද්‍රීය අපරාධවලට එරෙහිව සටන් කිරීම අපගේ ප්‍රතිපත්තිවල අරමුණ වනු ඇත.

V. **පාරිසරික තිරසාරභාවය (Environmental Sustainability):** සමුද්‍රීය මෙහෙයුම්වල පාරිසරික තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාව කැපවී සිටී. සමුද්‍රීය ක්‍රියාකාරකම්වලින් පරිසරයට සිදුවන බලපෑම අවම කිරීම සඳහා නැව්ගත කිරීම් මඟින් සිදුවන විමෝචනය (Emissions) අවම කිරීම, වරාය සහ වෙරළබඩ ප්‍රදේශවල දූෂණය අවම කිරීම, සාගර ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම මෙන්ම හරිත තාක්ෂණයන් සහ භාවිතයන් වැළඳ ගැනීම ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අපගේ ප්‍රතිපත්ති අවධානය යොමු කරනු ඇත.

VI. **ජාත්‍යන්තර සහයෝගීතාව (International Collaboration):** පොදු සමුද්‍රීය අභියෝගවලට විසඳුම් සෙවීමේදී සහ අන්‍යෝන්‍ය සමෘද්ධිය ප්‍රවර්ධනය කිරීමේදී ජාත්‍යන්තර සහයෝගීතාවයේ වැදගත්කම අපි හඳුනා ගනිමු. සමුද්‍රීය සබැඳියාවන් සහ සහයෝගීතාව ඉහළ නැංවීම සඳහා අසල්වැසි රටවල්,

කලාපීය සංවිධාන සහ ජාත්‍යන්තර පාර්ශවකරුවන් සමඟ පවතින හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීමට අපගේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවය දෙනු ඇත.

VII. **නියාමන රාමුව සහ පාලනය (Regulatory Framework and Governance):** සමුද්‍රීය ක්‍රියාකාරකම් සඳහා විනිවිදභාවයෙන් යුත්, පුරෝකථනය කළ හැකි සහ හිතකර නියාමන රාමුවක් ස්ථාපිත කිරීමට ශ්‍රී ලංකාව කැපවී සිටී. වෙළඳ නැව් ලේකම් කාර්යාලය (MSS) වෙනුවට ජාතික සමුද්‍රීය පරිපාලනය ලෙස ශ්‍රී ලංකා සමුද්‍රීය අධිකාරිය (MASL) බල ගැන්වීම මීට ඇතුළත් වේ. සමුද්‍රීය පාර්ශවකරුවන් සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා ජාත්‍යන්තර සමුද්‍රීය නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම, පාලනය සහ ආයතනික ධාරිතාව ඉහළ නැංවීම මෙන්ම යහපාලන භාවිතයන් ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අපගේ ප්‍රතිපත්ති අවධානය යොමු කරනු ඇත.

මෙම ප්‍රතිපත්ති ප්‍රකාශන මඟින් සමුද්‍රීය ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකාවේ උපායමාර්ගික ප්‍රමුඛතා සහ කැපවීම් මැනවින් පෙන්වා දෙන අතර, තිරසාර සංවර්ධනය සහ සමෘද්ධිය උදෙසා අපගේ සමුද්‍රීය ක්ෂේත්‍රයේ පූර්ණ විභවය ප්‍රයෝජනයට ගැනීමට ගන්නා උත්සාහයන්ට මග පෙන්වයි.

## 6. ප්‍රතිපත්ති අරමුණු (Policy Goals)

ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තිය සැලසුම් කර ඇත්තේ රටේ උපායමාර්ගික ප්‍රමුඛතා සහ සමුද්‍රීය ක්ෂේත්‍රය පිළිබඳ අපේක්ෂාවන් සමඟ සමපාත වන පොදු අරමුණු සමුදායක් ළඟා කර ගැනීම සඳහා ය. මෙම අරමුණු මඟින් ආර්ථික සංවර්ධනය ඇති කිරීම, වෙළඳ සබැඳියාවන් නැංවීම, ධජ (Flag), වෙරළබඩ (Coastal) සහ වරාය (Port) රාජ්‍යයක් ලෙස ආරක්ෂාව සහ සුරක්ෂිතතාව සහතික කිරීම, පාරිසරික තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීම, ජාත්‍යන්තර සහයෝගීතාව වර්ධනය කිරීම සහ සමුද්‍රීය ක්‍රියාකාරකම් සඳහා හිතකර නියාමන රාමුවක් සැපයීම වෙනුවෙන් ශ්‍රී ලංකාව සතු කැපවීම පිළිබිඹු කරයි. ප්‍රධාන ප්‍රතිපත්ති අරමුණු පහත පරිදි වේ:

I. **ආර්ථික වර්ධනය සහ තරඟකාරිත්වය (Economic Growth and Competitiveness):** ශ්‍රී ලංකාව සමුද්‍රීය රාජ්‍යයක් ලෙස සිය ආර්ථික වර්ධනය උත්තේජනය කිරීමට සහ තරඟකාරිත්වය ඉහළ නැංවීමට අරමුණු කරයි. දළ දේශීය නිෂ්පාදනය (GDP) සඳහා සමුද්‍රීය ක්ෂේත්‍රයෙන් ලැබෙන දායකත්වය වැඩි කිරීම, වරාය යටිතල පහසුකම් සහ ආශ්‍රිත කර්මාන්ත සඳහා ආයෝජන ආකර්ෂණය කර ගැනීම සහ සමුද්‍රීය වෙළඳාම සහ ආයෝජන සඳහා ශ්‍රී ලංකාව වඩාත් කැමති ගමනාන්තයක් ලෙස ස්ථානගත කිරීම මීට ඇතුළත් වේ.

II. **වෙළඳ පහසුකම් සැලසීම සහ සබැඳියාව (Trade Facilitation and Connectivity):** මෙම ප්‍රතිපත්තිය හරහා වෙළඳ පහසුකම් සහ සබැඳියාවන් වැඩි දියුණු කිරීමට ශ්‍රී ලංකාව අපේක්ෂා කරයි. භාණ්ඩ හා සේවාවල වඩාත් සුමට සංචලනයක් සඳහා වරාය මෙහෙයුම් ප්‍රශස්ත කිරීම, භාණ්ඩ නිශ්කාශන කාලය අවම කිරීම, ප්‍රවාහන ජාලයන් වැඩි දියුණු කිරීම සහ කලාපීය මෙන්ම ගෝලීය වෙළඳපොළවල් සමඟ පවතින සබැඳියාවන් ඉහළ නැංවීම මීට ඇතුළත් වේ.

III. **සමුද්‍රීය මානව සම්පත් (Marine Human Resources):** අපගේ නාවික කුසලතාවන්ගෙන් තවදුරටත් ආර්ථික ප්‍රතිලාභ ජනනය කර ගැනීමේ විභවය ශ්‍රී ලංකාව සතුය. ඉදිරි වසර දහය තුළ සක්‍රීයව සේවය කරන නාවිකයන් සංඛ්‍යාව තුන් ගුණයකින් වැඩි කිරීමටත්, එම කාලය තුළම ආදායම හතර ගුණයකින් වැඩි කිරීමටත් කර්මාන්තය සතුව අභිලාෂකාමී සැලසුම් පවතී. කෙසේ වෙතත්, දැනට ශ්‍රී ලංකාවට

වෙන්වී ඇත්තේ කැපවූ පුරප්පාඩු (Dedicated slots) 6,000 ක් පමණක් වීම ක්ෂේත්‍රය මුහුණ දෙන ප්‍රධාන අභියෝගයකි. මෙය කර්මාන්තයේ ආක්‍රමණශීලී වර්ධන අරමුණු සඳහා විශාල බාධාවකි. එලෙසම, සුදුසුකම් ලැබීමෙන් පසු ආධුනික මට්ටමේ (Entry level) නාවිකයන් බඳවා ගැනීම තරමක් මන්දගාමී වී ඇති අතර, එය ක්ෂේත්‍රයට පිවිසෙන නවකයින්ට සැලකිය යුතු අභියෝග මතු කරයි. එබැවින්, පාර්ශවකරුවන්ගේ සහය ඇතිව ඵලදායී සන්නාමකරණ (Branding) උපායමාර්ගයක් සකස් කිරීම සහ ගෝලීය මට්ටමින් ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම වැදගත් වේ.

ඒ අනුව, සමුද්‍රීය මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා කර්මාන්තය පහත සඳහන් **ප්‍රධාන කුළුණු පහ (05)** කෙරෙහි අවධානය යොමු කිරීමට අරමුණු කරයි:

- ප්‍රමිතිකරණය, ගුණාත්මකභාවය සහතික කිරීම සහ නියාමන ප්‍රතිසංස්කරණ
- සමුද්‍රීය අධ්‍යාපනය සහ පුහුණුව
- අංශ පදනම් කරගත් රැකියා නියුක්ති සංවර්ධනය
- ගෝලීය ප්‍රවර්ධන කටයුතු
- නාවිකයන්ගේ යහපැවැත්ම සහ සුබසාධනය

- **ප්‍රමිතිකරණය, ගුණාත්මකභාවය සහතික කිරීම සහ නියාමන ප්‍රතිසංස්කරණ (Standardization, Quality Assurance & Regulatory Reforms)**

දේශනවල ගුණාත්මකභාවය, යටිතල පහසුකම්, ආචාර්ය මණ්ඩලය, ඉගෙනුම් ප්‍රතිඵල සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ඇතුළත් කරගැනීමේ ප්‍රතිපාදන ආවරණය වන පරිදි වාරික විගණන (Periodic audits) සහ අඛණ්ඩ අධීක්ෂණය මඟින් ශ්‍රී ලංකාව සමුද්‍රීය අධ්‍යාපන හා පුහුණු (MET) නියාමන අධීක්ෂණය ශක්තිමත් කරනු ඇත.

ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානයේ (IMO) ආදර්ශ පාඨමාලා, නියාමන යාවත්කාලීන කිරීම්, තාක්ෂණික දියුණුව සහ ගෝලීය අවශ්‍යතා සමඟ සමපාත වන පරිදි විෂයමාලා සහ ඇගයීම් වාර්ෂිකව යාවත්කාලීන කරනු ලැබේ.

නෞකාවන් තුළ ඵලදායී සන්නිවේදනයක් සහතික කිරීම සඳහා සියලුම CDC (Continuous Discharge Certificate) අයදුම්කරුවන් සඳහා අනිවාර්ය ඉංග්‍රීසි ප්‍රවීණතා පරීක්ෂණයක් අදාළ වේ.

ශ්‍රී ලංකා සමුද්‍රීය අධිකාරිය, ආගමන විගමන දෙපාර්තමේන්තුව, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, වරායන් සහ නාවිකයන් බඳවා ගැනීමේ සහ ස්ථානගත කිරීමේ සේවාවන් (SRPS) සම්බන්ධ කරන ජාතික ඩිජිටල් අනන්‍යතා සත්‍යාපන පද්ධතියක් මඟින් සහතික වලංගුභාවය විධිමත් කිරීම, වංචා අවම කිරීම සහ විනිවිදභාවය ශක්තිමත් කිරීම සිදු කෙරේ.

සේවා හැර යාම (Desertion), වීසා බලපත්‍ර උල්ලංඝනය කිරීම්, ලේඛන වංචා සහ සදාචාර විරෝධී හැසිරීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා පැහැදිලි විනය ක්‍රියාපටිපාටි සකස් කරනු ඇත.

ETO (Electro-Technical Officer) සහ COC (Certificate of Competency) මාර්ග සඳහා වන ප්‍රතිසංස්කරණ මඟින් සිමියුලේටර් (Simulation) භාවිතයෙන් අවශ්‍ය මුහුදු සේවා කාලය (Sea time) අඩු කරනු ලබන අතර, නෞකා ඉංජිනේරු ආධුනික ශිෂ්‍යයන්ට අනිවාර්ය නැව් තටාකාංගන (Shipyard) පුහුණුව හෝ වෙනත් අනුමත වැඩමුළු පුහුණුවීම් ලබා ගැනීමට ඉඩ සලසයි.

මූලික ද්‍රව ප්‍රවාහන නෞකා පුහුණුව සඳහා පමණක් පූර්ව මුහුදු සේවා කාලයකින් තොරව ලියාපදිංචි වීමට ඉඩ සලසමින් ද්‍රව පුවාහන නෞකා පුහුණු (Tanker training) සුදුසුකම් නවීකරණය කරනු ලැබේ.

MET අනුමැතීන්ට ස්ත්‍රී-පුරුෂ භාවය සංවේදී අවශ්‍යතා ඇතුළත් කරනු ඇත; ඒ සඳහා හිරිහැර විරෝධී ප්‍රතිපත්ති, ආරක්ෂිත පැමිණිලි කිරීමේ යාන්ත්‍රණ, අඛණ්ඩ අධීක්ෂණය, වාරික විගණනය සහ ස්ත්‍රී-පුරුෂ භාවය අනුව වෙන් කරන ලද වාර්ෂික වාර්තාකරණය ඇතුළත් වේ.

MET ආයතනවල සම්පත්දායකයින් සහ MASL හි ඇගයීම්කරුවන් ක්ෂේත්‍රයේ සහ නියාමන ක්ෂේත්‍රයේ නවතම වර්ධනයන් සමඟ නිරන්තරයෙන් යාවත්කාලීන වන බව අධීක්ෂණය කෙරේ.

- **සමුද්‍රීය අධ්‍යාපනය, පුහුණුව සහ නිපුණතා සංවර්ධනය (Maritime Education, Training & Skills Development)**

STCW (Seafarers' Training, Certification and Watchkeeping) සම්මුතියට අනුකූල ඒකාබද්ධ ජාතික විෂයමාලාවකට ඩිජිටල් මෙවලම්, දෙමුහුන් (Hybrid) ඉගැන්වීම්, සිමියුලේටර් පාදක ඇගයීම්, මානසික සෞඛ්‍ය දැනුවත්භාවය සහ ස්ත්‍රී-පුරුෂ සංවේදීතා පුහුණුව ඇතුළත් කරනු ඇත.

NVQ (National Vocational Qualification) සුදුසුකම් ලත් ශිල්පීන්ට සමුද්‍රීය වෘත්තීන් වෙත පිවිසීම සඳහා ව්‍යුහගත පරිවර්තන මාර්ග සකස් කෙරෙන අතර, විදුලි කාර්මිකයන්ට ETO සහතිකය ලබා ගැනීම සඳහා සහයෝගය දෙනු ලැබේ.

දේශීය යාත්‍රා සඳහා වන සංශෝධිත COC ක්‍රමවේද (2000 kW දක්වා NCV ප්‍රධාන ඉංජිනේරු, 3000 GRT දක්වා මාස්ටර්, සහ ටග් මාස්ටර්/මේට් ඇතුළුව) දේශීය සමුද්‍රීය ධාරිතාව ශක්තිමත් කරනු ඇත.

වැඩි දියුණු කළ සිමියුලේෂන් සහ ආරක්ෂක පහසුකම් සමඟින්, සියලුම අනිවාර්ය කෙටි පාඨමාලා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව පැවැත්වීම සඳහා රජයේ පුහුණු මධ්‍යස්ථාන නවීකරණය කරනු ලැබේ.

සියලුම MET ආයතන තුළ කාන්තා සහභාගීත්වය පුළුල් කිරීම සඳහා ඇතුළත් කිරීමේ ඉලක්ක, ශිෂ්‍යත්ව, නේවාසිකාගාර පහසුකම් සහ කාන්තාවන් සඳහා ආරක්ෂිත නවාතැන් හා සනීපාරක්ෂක පහසුකම් සලසා දෙනු ඇත.

COC (FG - Foreign Going) හිමිකරුවන්ට උපාධි මට්ටමේ සුදුසුකම් ලබා ගැනීම සඳහා මාර්ගයක් ස්ථාපිත කිරීම.

ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරීන්ගේ පුහුණුව සහ මුහුදු සේවය ඇගයීමට ලක් කර පිළිගැනීමෙන්, ඔවුන්ට වෙළඳ නාවික ක්ෂේත්‍රයට (Merchant Navy) සංක්‍රමණය වීම සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

- **අංශ පදනම් කරගත් රැකියා නියුක්ති සංවර්ධනය (Segment-Wise Employment Development)**

ජාතික නාවික දක්ෂතා ද්වාරයක් (National Seafarer Talent Portal) මඟින් සත්‍යාපිත පැතිකඩ, ඩිජිටල් සහතික, සේවා යෝජක ප්‍රවේශය සහ විදේශ විනිමය ලුහුබැඳීම මෙන්ම, සමුද්‍රීය ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන් සඳහාම වෙන්වූ ලේඛනයක් (Women in Maritime Employment Registry) සපයනු ඇත.

ශ්‍රී ලංකාව ඉලක්කගත ගිවිසුම් සහ කර්මාන්ත හවුල්කාරිත්වයන් හරහා යුරෝපයේ සහ ආසියාවේ ප්‍රධාන රැකියා වෙළඳපොළවල් කෙරෙහි අවධානය යොමු කරනු ඇත. ගෝලීය ඉල්ලුමට සපුරාලීම සඳහා LNG,

පිටත වරායන් (Offshore), මගී ප්‍රවාහන නෞකා (Cruise) සහ EU ධජය සහිත නෞකා සඳහා විශේෂිත පුහුණු ශ්‍රමිකයන් බිහි කරනු ලැබේ.

පුළුල් කරන ලද CDC කාණ්ඩවලට, මගී ප්‍රවාහන නෞකා සහ පිටත වරායන්හී රැකියා නියුක්තිය ඉහළ නැංවීම සඳහා ආහාර සැපයුම් (Catering) සහ ආගන්තුක සත්කාර (Hospitality) භූමිකාවන් නිල වශයෙන් ඇතුළත් කරනු ඇත.

සේවා යෝජක දිරිගැන්වීම්, ආගන්තුක සත්කාර, ඉංජිනේරු සහ වෛද්‍ය සහායක භූමිකාවන් සඳහා පුළුල් සහභාගීත්වයක් ලබා දීම මඟින් මෙන්ම, ප්‍රසූත නිවාඩු හෝ රැකවරණ විරාමයන්ගෙන් පසු නැවත සේවයට පැමිණෙන කාන්තාවන් සඳහා ව්‍යුහගත නැවත ඇතුළත් වීමේ වැඩසටහන් හරහා කාන්තා රැකියා නියුක්තිය දිරිමත් කරනු ලැබේ.

- **ගෝලීය ප්‍රවර්ධන සහ ජාත්‍යන්තර සන්නාමකරණය (Global Promotions & International Branding)**

ශ්‍රී ලංකාව සිය විනයගරුක, ඩිජිටල් ලෙස සත්‍යාපනය කළ සහ ස්ත්‍රී-පුරුෂ සමතුලිතතාවයෙන් යුත් සමුද්‍රීය ශ්‍රම බලකාය ඉස්මතු කරමින් ගෝලීයව ශක්තිමත් අනන්‍යතාවයක් ගොඩනඟනු ඇත.

සන්නාමකරණ තේමාවන් විදේශ විනිමය දායකත්වය, ගෝලීය තරඟකාරිත්වය සහ ඇතුළත් කරගැනීම (Inclusivity) කෙරෙහි අවධානය යොමු කරනු ඇත.

සමුද්‍රීය සම්බන්ධතා නිලධාරීන් (Maritime Liaison Officers), තානාපති කාර්යාල සඳහා වන නාවික ප්‍රවර්ධන මෙවලම් කට්ටල (Seafarer Promotion Toolkits) සහ වාර්ෂික ගෝලීය සමුද්‍රීය දක්ෂතා සංසද (Maritime Talent Forums) හරහා රාජ්‍ය තාන්ත්‍රික ජාලයන් ශක්තිමත් කරනු ලැබේ.

රජයෙන් රජයට (G2G) ඇති කර ගන්නා ගිවිසුම් මඟින් ආධුනික නැව් පුරප්පාඩු, නිලධාරී තනතුරු සහ රේටින්ග්ස් (Rating) කෝටාවන් සුරක්ෂිත කරනු ඇත.

ශ්‍රී ලාංකික නාවිකයන් සඳහා විදේශයන්හි රැකියා අවස්ථා සෙවීම සඳහා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය සමඟ එක්ව විශේෂ අංශයක් සංවර්ධනය කිරීම.

ජාත්‍යන්තර ප්‍රචාරක වැඩසටහන් වලදී කාන්තා සමුද්‍රීය වෘත්තිකයන් කැපී පෙනෙන ලෙස ඉදිරිපත් කෙරෙන අතර, ඔවුන්ගේ දෘශ්‍යතාව වැඩි දියුණු කිරීම සඳහා IMO හි 'සමුද්‍රීය ක්ෂේත්‍රයේ කාන්තාවන්ගේ වැඩසටහන' (Women in Maritime Programme) සහ WISTA සමඟ හවුල්කාරිත්වයන් ඇති කර ගනු ලැබේ.

- **නාවිකයන්ගේ යහපැවැත්ම, සුබසාධනය සහ සමාජ ආරක්ෂණය (Seafarer Wellbeing, Welfare & Social Protection)**

විස්තීර්ණ යහපැවැත්මේ වැඩසටහන්වලට පැය 24 පුරා ක්‍රියාත්මක උපදේශන ක්ෂණික ඇමතුම් අංකයක්, MET හි චිත්තවේගීය සෞඛ්‍ය අධ්‍යාපනය සහ IMO/ITF මාර්ගෝපදේශවලට අනුකූල නෞකාගත යහපැවැත්මේ ප්‍රොටෝකෝල ඇතුළත් වේ.

ජාතික එන්නත්කරණ සහ වෛද්‍ය වැඩසටහනක් මඟින් සමුද්‍රීය වෛද්‍ය ප්‍රමිතීන්ට අනුකූල වීම සහ වාරික සෞඛ්‍ය පරීක්ෂණ සහතික කරනු ඇත.

මූල්‍ය සාක්ෂරතා පුහුණුව මඟින් නාවිකයින්ට තම ප්‍රේෂණ (Remittances), ඉතුරුම් සහ ආයෝජන කළමනාකරණය කිරීමට සහාය වන අතර, එමඟින් පවුලේ මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කෙරේ.

නේවාසික පුහුණු වන්නන් මුහුණ දෙන නවාතැන් පහසුකම් පිළිබඳ ගැටලුව ලිහිල් කිරීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් (PPP) හරහා සහනදායී නේවාසිකාගාර පහසුකම් සංවර්ධනය කරනු ඇත.

ප්‍රමිතිගත ජාතික කැඩෙට් බඳවා ගැනීමේ ප්‍රතිපත්තියක් මඟින් පුරප්පාඩු පියවීමත් කරන අතර නැව් හිමියන් දිරිමත් කරනු ඇත.

ස්ත්‍රී-පුරුෂ භාවයට විශේෂිත වූ සුබසාධන ක්‍රියාමාර්ගවලට හිරිහැර විරෝධී පද්ධති, ආරක්ෂිත නෞකාගත පැමිණිලි ක්‍රමවේද, කාන්තාවන්ට හිතකර කුටි සහ සනීපාරක්ෂක පහසුකම්, MLC 2006 යටතේ මාතෘ ආරක්ෂණයන් මෙන්ම කාන්තා කාර්ය මණ්ඩලය සඳහා විශේෂයෙන් සකස් කරන ලද මානසික සෞඛ්‍ය සහ ආරක්ෂණ වැඩසටහන් ඇතුළත් වේ.

නාවිකයින් සඳහා වන සාගර ශ්‍රම සම්මුතියේ (MLC) අවශ්‍යතා සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම; මීට අවම වයස, වෛද්‍ය සහතික කිරීම්, වැටුප්, නිවාඩු සහ මෙරටට ගෙන්වා ගැනීම (Repatriation) පිළිබඳ නිශ්චිත තොරතුරු ඇතුළත් අත්සන් කරන ලද සේවා ගිවිසුමක්, සාධාරණ කොන්දේසි සහ යහපත් ජීවන/සේවා පරිසරයක් සඳහා ඇති අයිතිවාසිකම් මෙන්ම ඔවුන්ගේ සුබසාධනය ඇතුළත් වේ.

IV. **සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රවර්ධනය (Promotion of Small & Medium Scale Enterprises):** සමුද්‍රීය සහ සේවා සැපයුම් (Logistics) ක්ෂේත්‍රයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් (SMEs) ප්‍රවර්ධනය කිරීම මඟින් ආර්ථික වර්ධනය, රැකියා උත්පාදනය සහ සමස්ත කර්මාන්තයේ සංවර්ධනය සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දිය හැකිය.

V. **යටිතල පහසුකම් සංවර්ධනය (Infrastructure Development):** වර්ධනය වන වෙළඳ පරිමාවන්, විශාල ප්‍රමාණයේ නෞකා සහ පාරිභෝගිකයින්ගේ දිනෙන් දින වෙනස් වන අවශ්‍යතා සඳහා ඉඩකඩ සැලසීමට ශ්‍රී ලංකාව සිය ප්‍රතිපත්තිය තුළ යටිතල පහසුකම් සංවර්ධනයට ප්‍රමුඛතාවය දෙයි. තිරසාර ආර්ථික වර්ධනයකට අනුබල දීම සඳහා වරාය පහසුකම් නවීකරණය කිරීම, වරාය ධාරිතාව පුළුල් කිරීම, ප්‍රවාහන ජාලයන් ඉහළ නැංවීම සහ අභ්‍යන්තර ගොඩබිම් සබැඳියාවන් (Hinterland connectivity) ශක්තිමත් කිරීම මීට ඇතුළත් වේ.

VI. **ආරක්ෂාව සහ සුරක්ෂිතතාව (Safety and Security):** සමුද්‍රීය ක්‍රියාකාරකම්වල ආරක්ෂාව සහ සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාව ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දෙයි. අපගේ සමුද්‍රීය අවශ්‍යතා සහ ජාතික ආරක්ෂාව සුරැකීම සඳහා සමුද්‍රීය ආරක්ෂක ධාරිතාවන් ශක්තිමත් කිරීම, නිරීක්ෂණ සහ අධීක්ෂණ පද්ධති ඉහළ නැංවීම, මුහුදු කොල්ලකෑම්, ත්‍රස්තවාදය සහ සමුද්‍රීය අපරාධවලට එරෙහිව සටන් කිරීම මෙන්ම ජාත්‍යන්තර ආරක්ෂණ ප්‍රමිතීන්ට අනුකූල වීම ප්‍රවර්ධනය කිරීම මෙහි ප්‍රතිපත්තිමය අරමුණු වේ.

VII. **පාරිසරික තිරසාරභාවය (Environmental Sustainability):** පාරිසරික තිරසාරභාවය යනු ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තියේ ප්‍රධාන අවධානය යොමු වූ ක්ෂේත්‍රයකි. සමුද්‍රීය ක්‍රියාකාරකම්වලින් පරිසරයට සිදුවන බලපෑම අවම කිරීම සඳහා නැව්ගත කිරීම් මඟින් සිදුවන විමෝචනය (Emissions) අවම කිරීම, වරාය සහ වෙරළබඩ ප්‍රදේශවල දූෂණය අවම කිරීම, සාගර

ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම මෙන්ම හරිත තාක්ෂණයන් සහ භාවිතයන් වැළඳ ගැනීම ප්‍රවර්ධනය කිරීම මීට ඇතුළත් වේ.

VIII. **ජාත්‍යන්තර සහයෝගීතාව සහ රාජ්‍ය තාන්ත්‍රිකභාවය (International Collaboration and Diplomacy):** මෙම ප්‍රතිපත්තිය හරහා ජාත්‍යන්තර සහයෝගීතාව සහ රාජ්‍ය තාන්ත්‍රිකභාවය ඉහළ නැංවීමට ශ්‍රී ලංකාව අරමුණු කරයි. පොදු සමුද්‍රීය අභියෝගවලට විසඳුම් සෙවීම සහ අන්‍යෝන්‍ය සමෘද්ධිය ප්‍රවර්ධනය කිරීම සඳහා අසල්වැසි රටවල්, කලාපීය සංවිධාන සහ ජාත්‍යන්තර පාර්ශවකරුවන් සමඟ පවතින හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීම, සංවාද, තොරතුරු හුවමාරුව සහ ඒකාබද්ධ මුලපිරීම් දිරිමත් කිරීම මීට ඇතුළත් වේ.

IX. **නියාමන රාමුව සහ පාලනය (Regulatory Framework and Governance):** සමුද්‍රීය ක්‍රියාකාරකම් සඳහා විනිවිදභාවයෙන් යුත්, පුරෝකථනය කළ හැකි සහ හිතකර නියාමන රාමුවක් ස්ථාපිත කිරීමට ශ්‍රී ලංකාව අපේක්ෂා කරයි. සමුද්‍රීය පාර්ශවකරුවන් සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා ජාත්‍යන්තර සමුද්‍රීය නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම, පාලනය සහ ආයතනික ධාරිතාව ඉහළ නැංවීම මෙන්ම යහපාලන භාවිතයන් ප්‍රවර්ධනය කිරීම මෙහි අරමුණයි.

X. **නෞකා වාර්තාකරණය (Ship Reporting):** ශ්‍රී ලංකාවට දකුණින් සිදුවන නෞකා ගමනාගමනය නිරීක්ෂණය කිරීමේදී, උපරිම නෞකා ගමනාගමනය සහ ගමනාගමන ඝනත්වය ශ්‍රී ලංකාවේ ගාල්ලට ඔබ්බෙන් දක්නට ලැබෙන බව නිරීක්ෂණය වී ඇත. පර්සියානු ගල්ෆ් කලාපය, ඉන්දියානු වෙරළ තීරය සහ ඒඩන් බොක්ක (Gulf of Aden) වෙතින් පැමිණෙන සමස්ත ගමනාගමනය අංශක අටේ නාලිකාව (Eight-degree channel) හරහා ගාල්ලට ඔබ්බෙන් එකිනෙකට සංකේන්ද්‍රනය වීම ඊට හේතුවයි. නෞකා විවිධ දිශාවලින් පැමිණෙන බැවින් සහ ගාල්ලට ළඟා වූ පසු ඒ සියල්ලම තම ගමන් මඟ වෙනස් කරන බැවින්, එකිනෙකට ප්‍රතිවිරුද්ධ ගමනාගමනය වෙන් කරනවා පමණක් නොව, සුදුසු ස්ථානයකදී ඒකාකාරී ලෙස ගමන් මඟ වෙනස් කිරීමට නෞකාවලට මඟ පෙන්වන ගමනාගමන මංතීරු (Traffic lanes) සකස් කිරීම අත්‍යවශ්‍ය වේ. වඩාත්ම වැදගත් අංශය වන්නේ, දොන්ද්‍ර තුඩුවට (Dondra Head) ඔබ්බෙන් පිහිටි යාබද TSS (Traffic Separation Scheme) වෙතින්/වෙත ගලායාම පහසු වන පරිදි මෙම ගමනාගමන මංතීරු සකස් කිරීමයි. ගාල්ල ප්‍රදේශය පසුකර විශාල තෙල් නැව් (Oil tankers) විශාල ප්‍රමාණයක් ගමන් කරන බැවින් සහ එවැනි ටැංකි නෞකාවක සිදුවන ඕනෑම සමුද්‍රීය අනතුරක් ශ්‍රී ලංකාවට විශාල ආර්ථික විපතක් වන බැවින්, නාවික ගමනාගමනයේ ආරක්ෂාව, කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ සාගර පරිසරය ආරක්ෂා කිරීම සඳහා නෞකා කළමනාකරණ පද්ධතියක් (VMS) ස්ථාපනය කිරීම අත්‍යවශ්‍ය වේ.

මෙම ප්‍රතිපත්ති අරමුණු මඟින් සමුද්‍රීය ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකාවේ උපායමාර්ගික දිශානතිය මෙහෙයවන අතර, තිරසාර සංවර්ධනය සහ සමෘද්ධිය උදෙසා සමුද්‍රීය ක්ෂේත්‍රයේ පූර්ණ විභවය ප්‍රයෝජනයට ගැනීමට ගන්නා ප්‍රතිපත්තිමය ප්‍රමුඛතා, ක්‍රියාවන් සහ මැදිහත්වීම් පිළිබඳව දැනුවත් කරයි. මෙම අරමුණු කරා ක්‍රියා කිරීම තුළින්, ගෝලීය තලයේ ගතික සහ තරඟකාරී සමුද්‍රීය රාජ්‍යයක් ලෙස ස්ථානගත වීමට ශ්‍රී ලංකාව අපේක්ෂා කරයි.

## 7. අදාළත්වය සහ විෂය පථය (Applicability & Scope)

ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තිය සැලසුම් කර ඇත්තේ සමුද්‍රීය ක්ෂේත්‍රයේ විවිධ මානයන් පුරා පුළුල් ලෙස ක්‍රියාත්මක විය හැකි සහ අදාළ කරගත හැකි අයුරිනි. තිරසාර සංවර්ධනය සහ සමෘද්ධිය ළඟා කර ගැනීම සඳහා මෙම ප්‍රතිපත්තියේ සක්‍රීය භාවය සහතික කරනු වස්, එහි විෂය පථයට පුළුල් පරාසයක විහිදුණු

පාර්ශවකරුවන්, ක්‍රියාකාරකම් සහ මැදිහත්වීම් සිදුකළ යුතු ක්ෂේත්‍ර ඇතුළත් වේ. ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තියේ අදාළත්වය සහ විෂය පථය පහත පරිදි දක්වා ඇත:

I. **භූගෝලීය ආවරණය (Geographical Coverage):** මෙම ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ මුහුදු සීමාව (Territorial waters), වරායන්, වෙරළබඩ ප්‍රදේශ සහ සමුද්‍රීය කලාපයන් තුළ සිදුවන සියලුම සමුද්‍රීය ක්‍රියාකාරකම් සඳහා අදාළ වේ. ප්‍රධාන ජාත්‍යන්තර නැව් මාර්ග ආශ්‍රිතව ශ්‍රී ලංකාව පිහිටා ඇති උපායමාර්ගික පිහිටීම ද මෙහිදී සලකා බලා ඇති අතර, ඉන්දියන් සාගර කලාපයේ සමුද්‍රීය කේන්ද්‍රස්ථානයක් ලෙස රට සතු කාර්යභාරය මෙහිදී අවධාරණය කෙරේ.

II. **පාර්ශවකරුවන්ගේ දායකත්වය (Stakeholder Engagement):** රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශයේ ආයතන, සිවිල් සංවිධාන, අධ්‍යයන ආයතන සහ ජාත්‍යන්තර හවුල්කරුවන් ඇතුළු විවිධ පරාසයක පාර්ශවකරුවන් සම්බන්ධ කර ගැනීමට මෙම ප්‍රතිපත්තිය අපේක්ෂා කරයි. ප්‍රතිපත්තිය සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීමේ ක්‍රියාවලීන් සඳහා පාර්ශවකරුවන් සමඟ පවතින සහයෝගීතාව සහ උපදෙස් ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ.

III. **ආංශික ආවරණය (Sectoral Coverage):** ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තිය සමුද්‍රීය ක්ෂේත්‍රයට අයත් වරාය සංවර්ධනය, නැව් සේවා, සමුද්‍රීය වෙළඳාම, සැපයුම් දාම (Logistics), ධීවර කර්මාන්තය, සංචාරක ව්‍යාපාරය, සාගර සංරක්ෂණය සහ සමුද්‍රීය ආරක්ෂාව වැනි විවිධ අංශ ආමන්ත්‍රණය කරයි. මෙම අංශ පුරා සම්බන්ධීකරණය කරන ලද සහ ඒකාබද්ධ සංවර්ධනයක් සහතික කිරීම සඳහා එය සාකල්‍ය (Holistic) ප්‍රවේශයක් අනුගමනය කරයි.

IV. **ප්‍රතිපත්තිමය මෙවලම් (Policy Instruments):** සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම ප්‍රතිපත්තිය නියාමන, ආයතනික, මූල්‍ය සහ ධාරිතා වර්ධන මෙවලම්වල එකතුවක් භාවිතා කරයි. නිශ්චිත අවශ්‍යතා සහ ප්‍රමුඛතාවලට ගැලපෙන පරිදි සකස් කරන ලද නීති සම්පාදනය, රෙගුලාසි, ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ, දිරිගැන්වීම්, ආයෝජන, හවුල්කාරිත්වයන් සහ ධාරිතා වර්ධන මුලපිරීම් මීට ඇතුළත් විය හැකිය.

V. **කාලීන මානය (Temporal Dimension):** හදිසි අභියෝගවලට විසඳුම් සෙවීම සඳහා ක්ෂණික ක්‍රියාමාර්ගවල අවශ්‍යතාවය හඳුනා ගන්නා අතරම, කාලයත් සමඟ තිරසාර සංවර්ධනයක් සඳහා පදනම දැමීමේ අවශ්‍යතාවය ද පිළිගනිමින් මෙම ප්‍රතිපත්තිය කෙටිකාලීන සහ දිගුකාලීන අරමුණු යන දෙකම සලකා බලයි. වෙනස් වන තත්ත්වයන්ට සහ නැගී එන ප්‍රමුඛතාවලට අනුකූල වීම සඳහා වාරික සමාලෝචන, අධීක්ෂණය සහ ගැලපීම් සිදුකිරීමේ යාන්ත්‍රණයන් මීට ඇතුළත් වේ.

VI. **ජාත්‍යන්තර මානය (International Dimension):** මූලික වශයෙන් දේශීය ප්‍රමුඛතා කෙරෙහි අවධානය යොමු කළද, ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තිය ජාත්‍යන්තර සහයෝගීතාවයේ වැදගත්කම මෙන්ම ගෝලීය සමුද්‍රීය සම්මතයන්, ප්‍රමිතීන් සහ මුලපිරීම් සමඟ සමපාත වීමේ වැදගත්කම ද පිළිගනී. සමුද්‍රීය සබැඳියාවන් සහ සහයෝගීතාව ඉහළ නැංවීම සඳහා ජාත්‍යන්තර හවුල්කාරිත්වයන්, ගිවිසුම් සහ හොඳම භාවිතයන් උපයෝගී කර ගැනීමට එය උත්සාහ කරයි.

VII. **තිරසාරභාවය සහ ඔරොත්තු දීමේ හැකියාව (Sustainability and Resilience):** තිරසාරභාවය සහ ඔරොත්තු දීමේ හැකියාව යනු මෙම ප්‍රතිපත්තියේ අදාළත්වය සහ විෂය පථය පුරා දිවෙන ප්‍රධාන තේමාවන් වේ. සමුද්‍රීය ක්‍රියාකාරකම් මඟින් සමාජීය යහපැවැත්මට සහ අනාගත පරපුරේ සමෘද්ධියට ධනාත්මක දායකත්වයක් ලබා දීම සහතික කිරීම සඳහා තිරසාර සංවර්ධන මූලධර්ම, පාරිසරික සංරක්ෂණය, දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ සර්වභාගී (Inclusive) වර්ධනය පිළිබඳව එය අවධාරණය කරයි.

සාරාංශයක් ලෙස, ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තිය සමුද්‍රීය ක්ෂේත්‍රය තුළ පුළුල් පරාසයක විහිදුණු පාර්ශවකරුවන්, අංශ සහ අභියෝග ආමන්ත්‍රණය කරමින් සිය විෂය පථය තුළ අතිශයින්ම ප්‍රායෝගික සහ විස්තීර්ණ වේ. සාකල්‍ය සහ සියල්ලන් ඇතුළත් කරගත් ප්‍රවේශයක් අනුගමනය කිරීමෙන්, ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ක්ෂේත්‍රයේ ප්‍රතිලාභ සියලුම පාර්ශවකරුවන් වෙත උපරිමයෙන් ළඟා කර දීම සඳහා තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම, සබැඳියාවන් වැඩි දියුණු කිරීම, ආරක්ෂාව සහ සුරක්ෂිතතාව තහවුරු කිරීම සහ ජාත්‍යන්තර සහයෝගීතාව වර්ධනය කිරීම මෙම ප්‍රතිපත්තියේ අරමුණයි.

## 8. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම (Policy Implementation)

ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම යනු, ප්‍රතිපත්තිමය අරමුණු ප්‍රත්‍යක්ෂ ක්‍රියාමාර්ග සහ ප්‍රතිඵල බවට පරිවර්තනය කිරීම සඳහා වූ ක්‍රමවේද සහ සම්බන්ධීකරණ ප්‍රවේශයකි. ප්‍රතිපත්තිමය මුලපිරීම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සහතික කිරීම සඳහා මෙම ක්‍රියාවලිය විවිධ අදියරයන්, යාන්ත්‍රණයන් සහ පාර්ශවකරුවන්ගෙන් සමන්විත වේ. ශ්‍රී ලාංකේය සමුද්‍රීය සන්දර්භය තුළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන අංශ පහත පරිදි දක්වා ඇත:

I. **උපායමාර්ගික සැලසුම්කරණය (Strategic Planning):** සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තියේ දක්වා ඇති පොදු අරමුණු සහ ප්‍රමුඛතා සමඟ සමපාත වන සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලසුම් සහ උපාය මාර්ග සකස් කිරීමෙන් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය ආරම්භ වේ. මෙම සැලසුම් මඟින් ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ විවිධ පාර්ශවකරුවන් සඳහා වන නිශ්චිත අරමුණු, ඉලක්ක, කාලසීමාවන්, සම්පත් වෙන් කිරීම් සහ වගකීම් පැහැදිලිව දක්වයි.

II. **ආයතනික රාමුව (Institutional Framework):** ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ශක්තිමත් ආයතනික රාමුවක් පිහිටුවීම අත්‍යවශ්‍ය වේ. මීට අදාළ රාජ්‍ය ආයතන, නියාමන ආයතන, කර්මාන්ත සංගම්, සිවිල් සංවිධාන සහ අනෙකුත් පාර්ශවකරුවන් අතර බාධාවකින් තොර සහයෝගීතාව සහ තීරණ ගැනීම පහසු කිරීම සඳහා භූමිකාවන්, වගකීම් සහ සම්බන්ධීකරණ යාන්ත්‍රණයන් නිර්වචනය කිරීම ඇතුළත් වේ.

III. **ධාරිතා වර්ධනය (Capacity Building):** ප්‍රතිපත්තිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනික සහ මානව ධාරිතාව ඉහළ නැංවීම ඉතා වැදගත් වේ. පාර්ශවකරුවන්ට තම භූමිකාවන් ඵලදායී ලෙස ඉටු කිරීමට අවශ්‍ය කුසලතා, දැනුම සහ සම්පත් ලබා දීම සඳහා පුහුණු වැඩසටහන්, වැඩමුළු, සම්මන්ත්‍රණ, තාක්ෂණික සහාය සහ දැනුම බෙදාහදා ගැනීමේ වේදිකාවන් ධාරිතා වර්ධන මුලපිරීම්වලට ඇතුළත් විය හැකිය.

IV. **ව්‍යවස්ථාදායක සහ නියාමන ප්‍රතිසංස්කරණ (Legislative and Regulatory Reforms):** නෛතික රාමු ප්‍රතිපත්තිමය අරමුණු සමඟ සමපාත කිරීමට, අඩුපාඩු මඟහරවා ගැනීමට, ක්‍රියා පටිපාටි විධිමත් කිරීමට සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් හා හොඳම භාවිතයන්ට අනුකූල වීම සහතික කිරීමට ව්‍යවස්ථාදායක සහ නියාමන ප්‍රතිසංස්කරණ අවශ්‍ය විය හැකිය. අවශ්‍යතාවය පරිදි නව නීති කෙටුම්පත් කිරීම, පවතින රෙගුලාසි සංශෝධනය කිරීම හෝ මාර්ගෝපදේශ සහ ප්‍රමිතීන් සකස් කිරීම මීට ඇතුළත් වේ.

V. **ආයෝජන සහ යටිතල පහසුකම් සංවර්ධනය (Investment and Infrastructure Development):** සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වරාය වැඩිදියුණු කිරීම්, ප්‍රවාහන ජාල, සමුද්‍රීය පහසුකම් සහ අදාළ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා මූල්‍ය සම්පත් සහ ආයෝජන බලමුලු

ගැන්වීම අවශ්‍ය වේ. මහා පරිමාණ ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීමට රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් (PPPs) සහ සෘජු විදේශ ආයෝජන (FDI) උපයෝගී කර ගත හැකිය.

VI. **අධීක්ෂණය සහ ඇගයීම (Monitoring and Evaluation):** ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට, ප්‍රතිපත්තිමය මැදිහත්වීම්වල සක්‍රීය භාවය තක්සේරු කිරීමට, පවතින බාධා හෝ අභියෝග හඳුනා ගැනීමට සහ ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගවලට අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට අඛණ්ඩ අධීක්ෂණය සහ ඇගයීම අත්‍යවශ්‍ය වේ. ප්‍රතිපත්තිමය අරමුණු සහ ඉලක්ක කරා ළඟාවීමේ ප්‍රගතිය මැනීම සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) සහ මිණුම්දඬු ස්ථාපිත කරනු ලැබේ.

VII. **පාර්ශවකරුවන්ගේ දායකත්වය සහ සන්නිවේදනය (Stakeholder Engagement and Communication):** සහයෝගය ලබා ගැනීමට, ප්‍රතිපෝෂණ (Feedback) ලබා ගැනීමට, ගැටලු විසඳීමට සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ප්‍රයත්නයන් වටා පොදු එකඟතාවක් ගොඩනැගීමට පාර්ශවකරුවන් සම්බන්ධ කර ගැනීම සහ විවෘත සන්නිවේදන මාර්ග පවත්වා ගැනීම ඉතා වැදගත් වේ. සියල්ලන්ගේම සහභාගීත්වය සහ විනිවිදභාවය සහතික කිරීම සඳහා නිතිපතා උපදේශන, පාර්ශවකරුවන්ගේ රැස්වීම්, සංසද සහ ප්‍රජා සන්නිවේදන ක්‍රියාකාරකම් පවත්වනු ලැබේ.

VIII. **අවදානම් කළමනාකරණය සහ හදිසි අවස්ථා සැලසුම්කරණය (Risk Management and Contingency Planning):** අභියෝග කලින් හඳුනා ගැනීම සහ අවදානම් අවම කිරීම සාර්ථක ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමක අත්‍යවශ්‍ය කොටසකි. අයවැය සීමාවන්, තාක්ෂණික ගැටලු, දේශපාලන සාධක හෝ බාහිර බලපෑම් වැනි විභව අභියෝග හඳුනා ගැනීමට අවදානම් කළමනාකරණ උපාය මාර්ග සකස් කෙරෙන අතර, ඒවාට ක්‍රියාකාරීව මුහුණ දීම සඳහා හදිසි අවස්ථා සැලසුම් සකස් කරනු ලැබේ.

IX. **අනුවර්තන කළමනාකරණය (Adaptive Management):** වෙනස් වන තත්ත්වයන්, ප්‍රතිපෝෂණ සහ ලබාගත් අත්දැකීම් මත පදනම්ව නැවත නැවතත් ගැලපීම් සිදු කිරීමට හැකි වන පරිදි ක්‍රියාත්මක කිරීමේ සැලසුම් නම්‍යශීලී සහ අනුවර්තනය විය හැකි ඒවා වේ. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම කාලයාගේ ඇවෑමෙන් ප්‍රතිචාරාත්මක සහ ඵලදායී ලෙස පවතින බව සහතික කිරීම සඳහා, නැගී එන ප්‍රවණතා, හොඳම භාවිතයන් සහ වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීමට නිතිපතා සමාලෝචන සහ තක්සේරු කිරීම් පවත්වනු ලැබේ.

ක්‍රමානුකූල සහ සාකල්‍ය ප්‍රවේශයක් අනුගමනය කිරීමෙන්, ශ්‍රී ලංකාව සිය සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තියේ දක්වා ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීමටත්, තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමටත්, තරඟකාරිත්වය ඉහළ නැංවීමටත්, ආර්ථික වර්ධනය සහ සමාජීය යහපැවැත්ම සඳහා සමුද්‍රීය ක්ෂේත්‍රයේ ප්‍රතිලාභ උපරිම කිරීමටත් අපේක්ෂා කරයි.

## I. උපාය මාර්ග (Strategies)

ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග එහි අරමුණු ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීම අරමුණු කරගත් ප්‍රවේශයන් රැසකින් සමන්විත වේ. මෙම උපාය මාර්ග නිශ්චිත අභියෝගවලට විසඳුම් සෙවීමට, අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගැනීමට සහ ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ශක්තීන් ප්‍රයෝජනයට ගැනීමට හැකි වන පරිදි සකස් කර ඇත. සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන උපාය මාර්ග පහත පරිදි වේ:

i. **යටිතල පහසුකම් සංවර්ධනය (Infrastructure Development):** ධාරිතාව, කාර්යක්ෂමතාව සහ සබැඳියාව (Connectivity) ඉහළ නැංවීම සඳහා වරාය යටිතල පහසුකම්, ප්‍රවාහන ජාල සහ අදාළ පහසුකම් සඳහා වන ආයෝජනවලට ප්‍රමුඛතාවය දීම. විශාල නෞකාවලට පහසුකම් සැලසීම, භාණ්ඩ හැසිරවීමේ හැකියාවන් වැඩිදියුණු කිරීම සහ බාධාවකින් තොර බහු-ආකෘති (Intermodal) ප්‍රවාහනය පහසු කිරීම සඳහා වරායන් සංවර්ධනය කිරීම සහ නවීකරණය කිරීම.

ii. **ව්‍යාපාර කිරීමේ පහසුව පිළිබඳ දර්ශකය (Ease of Doing Business Index):**

- ලේඛන කටයුතු සහ සැකසුම් කාලය අඩු කිරීම සඳහා රේගු ක්‍රියා පටිපාටි, වරායට ඇතුළු වීම සහ නිෂ්කාශන (Clearance) ක්‍රියාවලීන් විධිමත් කිරීම.
- ප්‍රමාදයන් අවම කිරීම සඳහා සියලුම නියාමන අනුමැතීන් වෙනුවෙන් විද්‍යුත් ලේඛනගත කිරීම් (Electronic documentation) සහ ඩිජිටල් වේදිකාවන් ක්‍රියාත්මක කිරීම.
- කලාපීය සහ ගෝලීය වරායන් සමඟ තරඟකාරී විය හැකි පරිදි වරාය ගාස්තු, තීරුබදු සහ වෙනත් ගාස්තු සමාලෝචනය කිරීම සහ සාධාරණීකරණය කිරීම.
- ව්‍යාපාර සහ ආයෝජකයින් වෙත සමුද්‍රීය මෙහෙයුම්වලට අදාළ සියලුම පිරිවැය පිළිබඳ පැහැදිලි සහ විනිවිදභාවයෙන් යුත් තොරතුරු සැපයීම.

රජය විසින් ශ්‍රී ලාංකේය සමුද්‍රීය කර්මාන්තයේ වර්ධනය දිරිමත් කිරීම සඳහා අවශ්‍ය ඕනෑම අවස්ථාවක සහ ස්ථානයකදී ආකර්ෂණීය මූල්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ඇතුළු හැකි සෑම පියවරක්ම ගනු ඇත.

iii. **ආරක්ෂාව සහ සුරක්ෂිතතාව ඉහළ නැංවීම (Safety and Security Enhancement):** සමුද්‍රීය ක්‍රියාකාරකම්වල ආරක්ෂාව සහ සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා සමුද්‍රීය ආරක්ෂක ධාරිතාවන්, නිරීක්ෂණ පද්ධති සහ නියාමන රාමු ශක්තිමත් කිරීම. මුහුදු කොල්ලකෑම්, සමුද්‍රීය ත්‍රස්තවාදය සහ සමුද්‍රීය අපරාධවලට ඵලදායී ලෙස මුහුණ දීම සඳහා ජාත්‍යන්තර හවුල්කරුවන්, අසල්වැසි රටවල් සහ අදාළ සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

iv. **පාරිසරික තිරසාරභාවය (Environmental Sustainability):** තිරසාර නැව්ගත කිරීමේ භාවිතයන් ප්‍රවර්ධනය කිරීම, නෞකාවලින් සිදුවන විමෝචන (Emissions) අවම කිරීම සහ වරාය සහ වෙරළබඩ ප්‍රදේශවල දූෂණය අවම කිරීම. සමුද්‍රීය ක්ෂේත්‍රය තුළ හරිත තාක්ෂණයන්, බලශක්ති කාර්යක්ෂම භාවිතයන් සහ දූෂණය වැළැක්වීමේ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම දිරිමත් කිරීම සඳහා රෙගුලාසි, දිරිගැන්වීම් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

v. **මානව සම්පත් සංවර්ධනය (Human Resource Development):** සමුද්‍රීය කර්මාන්තයේ ඉල්ලුමට සපුරාලිය හැකි දක්ෂ ශ්‍රම බලකායක් ගොඩනැගීම සඳහා අධ්‍යාපන, පුහුණු සහ කුසලතා සංවර්ධන වැඩසටහන් සඳහා ආයෝජනය කිරීම. සමුද්‍රීය ක්ෂේත්‍රයට අදාළ විෂයමාලා, සහතික පත්‍ර සහ වෘත්තීය සංවර්ධන අවස්ථා සකස් කිරීම සඳහා අධ්‍යයන ආයතන, පුහුණු මධ්‍යස්ථාන සහ කර්මාන්ත සංගම් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

vi. **ජාත්‍යන්තර සහයෝගීතාව (International Collaboration):** සමුද්‍රීය සබැඳියාව ඉහළ නැංවීමට, තොරතුරු බෙදාහදා ගැනීම ප්‍රවර්ධනය කිරීමට සහ පොදු අභියෝගවලට මුහුණ දීම සඳහා අසල්වැසි රටවල්, කලාපීය සංවිධාන සහ ජාත්‍යන්තර පාර්ශවකරුවන් සමඟ හවුල්කාරිත්වය ශක්තිමත් කිරීම. සමුද්‍රීය ක්ෂේත්‍රය තුළ අන්‍යෝන්‍ය අවබෝධය සහ සහයෝගීතාව වර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර සංසද, ඒකාබද්ධ මුලපිරීම් සහ සමුපකාර ගිවිසුම්වලට දායක වීම.

vii. **නියාමන ප්‍රතිසංස්කරණ සහ යහපාලනය (Regulatory Reform and Governance):** ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ හොඳම භාවිතයන් සමඟ සමපාත වන බව සහතික කිරීම සඳහා පවතින සමුද්‍රීය නීති, රෙගුලාසි සහ පරිපාලන ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම. සමුද්‍රීය පාර්ශවකරුවන් සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම සඳහා නියාමන ක්‍රියාවලීන්හි විනිවිදභාවය, වගවීම සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.

viii. **සමුද්‍රීය සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම (Promotion of Maritime Tourism):** වෙරළබඩ ප්‍රදේශ, වරායන් සහ සමුද්‍රීය උරුමයන් සහිත ස්ථානවල සංචාරක සේවාවන් විවිධාංගීකරණය කිරීම, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ නරඹන්නන්ගේ අත්දැකීම් ඉහළ නැංවීම මඟින් ශ්‍රී ලංකාවේ සමුද්‍රීය සංචාරක විභවය සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම. තිරසාර සංචාරක භාවිතයන් සහතික කිරීම සඳහා සංචාරක කර්මාන්තය, පළාත් පාලන ආයතන සහ පාරිසරික සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

ix. **පර්යේෂණ සහ නවෝත්පාදන (Research and Innovation):** ඵලදායිතාව, තරඟකාරිත්වය සහ තිරසාරභාවය ඉහළ නැංවීම සඳහා සමුද්‍රීය ක්ෂේත්‍රය තුළ පර්යේෂණ, නවෝත්පාදන සහ තාක්ෂණය වැළඳ ගැනීම දිරිමත් කිරීම. ඉන්ධන කාර්යක්ෂමතාව, අපද්‍රව්‍ය කළමනාකරණය සහ සමුද්‍රීය ආරක්ෂාව වැනි සමුද්‍රීය අභියෝග සඳහා නව්‍ය විසඳුම් සකස් කිරීමට පර්යේෂණ ආයතන, නවක ව්‍යාපාර (Startups) සහ තාක්ෂණික ඉන්කියුබේටර් වෙත සහාය වීම.

මෙම උපාය මාර්ග ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමෙන් ශ්‍රී ලංකාව සිය සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තියේ දක්වා ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීමටත්, සමුද්‍රීය රාජ්‍යයක් ලෙස සිය ස්ථාවරය ශක්තිමත් කිරීමටත්, තිරසාර සංවර්ධනය සහ සමෘද්ධිය සඳහා සමුද්‍රීය ක්ෂේත්‍රයේ සමාජ-ආර්ථික ප්‍රතිලාභ උපරිම කිරීමටත් අපේක්ෂා කරයි.

## II. වගකීම සහ අධිකාරිය (Responsibility & Authority)

සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ සන්දර්භය තුළ වගකීම සහ අධිකාරිය යනු ප්‍රතිපත්තිමය මූලපිරීම් ක්‍රියාත්මක කිරීම, නියාමන අනුකූලතාව අධීක්ෂණය කිරීම සහ ප්‍රතිපත්තිමය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සම්බන්ධ වන විවිධ පාර්ශවකරුවන් වෙත පවරා ඇති භූමිකාවන් සහ බලතල වේ. ප්‍රධාන පාර්ශවකරුවන් අතර වගකීම් සහ අධිකාරී බලතල බෙදී යන ආකාරය පිළිබඳ දළ විශ්ලේෂණයක් පහත දැක්වේ:

i. **රාජ්‍ය ආයතන (Government Agencies):** රාජ්‍ය ආයතන සාමාන්‍යයෙන් සමුද්‍රීය ප්‍රතිපත්ති සැකසීම, ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම සඳහා වගකීම දරයි. ප්‍රතිපත්තිමය ඉලක්ක සපුරා ගැනීම සඳහා රෙගුලාසි සැකසීමට, සම්පත් වෙන් කිරීමට සහ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීමට ඔවුන්ට බලය ඇත. නිශ්චිත වගකීම්වලට පහත ඒවා ඇතුළත් විය හැකිය:

   අ. **වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය:** සමස්ත ප්‍රතිපත්ති සම්පාදනය, වරාය සංවර්ධනය සහ සමුද්‍රීය ප්‍රවාහනය සඳහා වගකීම දරයි.

   ආ. **සමුද්‍රීය පරිපාලනය (Maritime Administration):** සමුද්‍රීය ආරක්ෂාව, නෞකා තුළ පාරිසරික ආරක්ෂාව, නෞකා ලියාපදිංචිය සහ ජාත්‍යන්තර සමුද්‍රීය රෙගුලාසිවලට අනුකූල වීම අධීක්ෂණය කරයි.

   ඇ. **රේගු දෙපාර්තමේන්තුව:** වරාය සහ සමුද්‍රීය සීමාවන්හි රේගු ක්‍රියා පටිපාටි, තීරුබදු බලාත්මක කිරීම සහ වෙළඳ පහසුකම් සැලසීම කළමනාකරණය කරයි.

ඇ. **පාරිසරික ආයතන:** සමුද්‍රීය ක්ෂේත්‍රයේ පාරිසරික ප්‍රමිතීන් සහ දූෂණ පාලන ක්‍රියාමාර්ග නියාමනය කිරීම සහ බලාත්මක කිරීම සිදු කරයි.

ඉ. **ආරක්ෂක සහ සුරක්ෂිතතා ආයතන:** සමුද්‍රීය ආරක්ෂාව සහතික කිරීම, මුහුදු කොල්ලකෑම්, ත්‍රස්තවාදය සහ සමුද්‍රීය අපරාධ මර්දනය කිරීම සහ ජාතික අවශ්‍යතා ආරක්ෂා කිරීම සිදු කරයි.

ii. **නියාමන ආයතන (Regulatory Bodies):** නියාමන ආයතනවලට සමුද්‍රීය රෙගුලාසි, ප්‍රමිතීන් සහ බලපත්‍ර අවශ්‍යතාවලට අනුකූල වීම අධීක්ෂණය කිරීම පැවරී ඇත. සමුද්‍රීය ක්ෂේත්‍රය තුළ ආරක්ෂාව, සුරක්ෂිතතාව සහ පාරිසරික ආරක්ෂාව සහතික කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමට, පරීක්ෂණ පැවැත්වීමට සහ රෙගුලාසි බලාත්මක කිරීමට ඔවුන්ට අධිකාරී බලය ඇත. උදාහරණ ලෙස:

අ. **වරාය අධිකාරීන්:** ආරක්ෂක සහ පාරිසරික ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කරමින් වරාය මෙහෙයුම්, නැංගුරම් පොළවල් වෙන් කිරීම (Berth allocation) සහ වරාය සේවාවන් කළමනාකරණය කරයි.

ආ. **වෙරළාරක්ෂක බලකාය (Coast Guard):** ශ්‍රී ලංකා සමුද්‍රීය පරිපාලන ආයතනය (MASL) සමඟ සාකච්ඡා කර, සමුද්‍රීය අවශ්‍යතා ආරක්ෂා කිරීම, සමුද්‍රීය මුර සංචාර පැවැත්වීම සහ මුදු සීමාව තුළ සමුද්‍රීය නීති සහ රෙගුලාසි බලාත්මක කිරීම සිදු කරයි.

ඇ. **සමුද්‍රීය පොලිසිය:** නීතිය සහ සාමය පවත්වාගෙන යාම, සමුද්‍රීය අපරාධ වැළැක්වීම සහ වෙරළබඩ ප්‍රදේශ සහ සමුද්‍රීය කලාපවල හදිසි අවස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීම සිදු කරයි.

iii. **කර්මාන්ත සංගම් (Industry Associations):** කර්මාන්ත සංගම් මඟින් නැව් සමාගම්, වරාය ක්‍රියාකරුවන්, සේවා සැපයුම් සපයන්නන් සහ සමුද්‍රීය සේවා සපයන්නන් ඇතුළු සමුද්‍රීය පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා නියෝජනය කරයි. ඔවුන්ට ඍජු නියාමන බලයක් නොමැති වුවද, ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ වෙනුවෙන් පෙනී සිටීම, ප්‍රතිපත්ති සම්පාදනය සඳහා දායකත්වයන් සැපයීම සහ කර්මාන්ත සංවර්ධන මුලපිරීම් සහ ධාරිතා වර්ධන වැඩසටහන් හරහා ක්‍රියාත්මක කිරීමේ ප්‍රයත්නයන්ට සහාය වීම සිදු කරයි.

iv. **සිවිල් සංවිධාන (Civil Society Organizations - CSOs):** රාජ්‍ය නොවන සංවිධාන (NGOs) සහ ප්‍රජා කණ්ඩායම් ඇතුළු සිවිල් සංවිධාන, සමුද්‍රීය ක්ෂේත්‍රය තුළ තිරසාර සංවර්ධන භාවිතයන් අධීක්ෂණය කිරීම, ඒ වෙනුවෙන් පෙනී සිටීම සහ සහාය වීම සම්බන්ධයෙන් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඔවුන් උපදේශනය, පර්යේෂණ සහ ප්‍රජා දායකත්වය හරහා දැනුවත්භාවය ඇති කිරීම, මහජන සහයෝගය බලමුලු ගැන්වීම සහ පාර්ශවකරුවන් ඔවුන්ගේ ක්‍රියාවන්ට වගකිව යුතු බව සහතික කිරීම සිදු කරයි.

v. **ජාත්‍යන්තර හවුල්කරුවන් (International Partners):** ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික සංවිධාන, විදේශීය රජයන් සහ ජාත්‍යන්තර මූල්‍ය ආයතන ඇතුළු ජාත්‍යන්තර හවුල්කරුවන්, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා තාක්ෂණික සහාය, මූල්‍ය සහාය සහ විශේෂඥ දැනුම ලබා දෙයි. ඔවුන්ට ඍජු නියාමන බලයක් නොමැති වුවද, පොදු සමුද්‍රීය අභියෝගවලට මුහුණ දීමට, හොඳම භාවිතයන් ප්‍රවර්ධනය කිරීමට සහ ධාරිතා වර්ධන මුලපිරීම් පහසු කිරීමට ශ්‍රී ලංකාව සමඟ සහයෝගයෙන් කටයුතු කරයි.

vi. **පළාත් පාලන ආයතන (Local Authorities):** පළාත් සභා, මහා නගර සභා/නගර සභා/ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ප්‍රජාවන් ඇතුළු පළාත් පාලන ආයතන, බිම් මට්ටමේදී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ඔවුන් ජාතික ප්‍රතිපත්ති සහ අරමුණු සමඟ සමපාත වෙමින්, වෙරළබඩ ප්‍රදේශ, වරායන් සහ සමුද්‍රීය උරුමයන් සහිත ස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය, පාරිසරික සංරක්ෂණය සහ ප්‍රජා දායකත්ව මුලපිරීම් සඳහා සහාය දක්වයි.

මෙම පාර්ශවකරුවන් අතර වගකීම් සහ බලතල පැහැදිලිව වෙන්කර දැක්වීම මගින් ශ්‍රී ලංකාව සිය සමුද්‍රීය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී ඵලදායී පාලනයක්, නියාමන අනුකූලතාවක් සහ සම්බන්ධීකරණයක් සහතික කිරීමට අපේක්ෂා කරන අතර, එමගින් සමුද්‍රීය ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනය සහ සමෘද්ධිය ඇති කරයි.

## III. අධීක්ෂණය සහ ඇගයීම (Monitoring & Evaluation)

අධීක්ෂණය සහ ඇගයීම (M&E) යනු ප්‍රගතිය තක්සේරු කිරීම, අභියෝග හඳුනා ගැනීම සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම්වල සක්‍රීය භාවය ඉහළ නැංවීම අරමුණු කරගත්, ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ රාමුවේ අත්‍යවශ්‍ය අංගයන් වේ. අධීක්ෂණ සහ ඇගයීම් ක්‍රියාවලියට ප්‍රතිපත්තිමය අරමුණුවලට සාපේක්ෂව කාර්ය සාධනය නිරීක්ෂණය කිරීම සහ තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සැපයීම සඳහා ක්‍රමානුකූල දත්ත එකතු කිරීම, විශ්ලේෂණය සහ ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයන් ඇතුළත් වේ. ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තියේ සන්දර්භය තුළ අධීක්ෂණය සහ ඇගයීමේ ප්‍රධාන අංග පහත පරිදි වේ:

i. **කාර්ය සාධන දර්ශක ස්ථාපිත කිරීම (Establishment of Performance Indicators):** ප්‍රතිපත්තිමය අරමුණු සහ ඉලක්ක කරා ළඟාවීමේ ප්‍රගතිය මැනීම සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) සහ මිණුම්දඬු නිර්වචනය කිරීම. ප්‍රතිපත්තිමය ප්‍රතිඵල පිළිබඳ අර්ථවත් තක්සේරුවකට පහසුකම් සැලසීම සඳහා මෙම දර්ශක නිශ්චිත (Specific), මැනිය හැකි (Measurable), ළඟා කර ගත හැකි (Achievable), අදාළ (Relevant) සහ කාලානුරූපී (Time-bound) එනම් SMART දර්ශක විය යුතුය.

ii. **දත්ත එකතු කිරීම සහ වාර්තා කිරීම (Data Collection and Reporting):** වරාය මෙහෙයුම්, නැව් සේවා, වෙළඳ පරිමාවන්, ආරක්ෂක සිදුවීම්, පාරිසරික දර්ශක සහ ආර්ථික කාර්ය සාධනය ඇතුළු සමුද්‍රීය ක්ෂේත්‍රයේ විවිධ අංශ පිළිබඳ අදාළ දත්ත සහ තොරතුරු රැස් කිරීම සඳහා යාන්ත්‍රණයන් සකස් කිරීම. දත්තවල අනුකූලතාව සහ විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා වාර්තාකරණ අවශ්‍යතා සහ ආකෘති ස්ථාපිත කිරීම.

iii. **නිතිපතා අධීක්ෂණ ක්‍රියාකාරකම් (Regular Monitoring Activities):** ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට, ප්‍රවණතා හඳුනා ගැනීමට සහ සමුද්‍රීය ක්ෂේත්‍රයේ මතුවන ගැටලු හඳුනා ගැනීමට නිතිපතා අධීක්ෂණ ක්‍රියාකාරකම් පැවැත්වීම. ප්‍රතිපත්තිමය මුලපිරීම් ක්‍රියාත්මක කිරීම සහ භූමියේ ඒවායේ බලපෑම ඇගයීම සඳහා වාරික සමාලෝචන, කාර්ය සාධන තක්සේරු කිරීම්, ක්ෂේත්‍ර චාරිකා, පාර්ශවකරුවන්ගේ උපදේශන සහ දත්ත විශ්ලේෂණයන් මීට ඇතුළත් විය හැකිය.

iv. **ප්‍රතිපත්තිමය මැදිහත්වීම් ඇගයීම (Evaluation of Policy Interventions):** නිශ්චිත ප්‍රතිපත්තිමය මැදිහත්වීම්, වැඩසටහන් සහ ව්‍යාපෘති මගින් ඒවායේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමේ සක්‍රීය භාවය ඇගයීම. ප්‍රතිපත්තිමය ක්‍රියාවන්හි ප්‍රතිඵල, නිමැවුම් සහ බලපෑම් තක්සේරු කිරීම සඳහා සමීක්ෂණ, සම්මුඛ සාකච්ඡා, සිද්ධි අධ්‍යයන (Case studies), පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය සහ බලපෑම් තක්සේරු කිරීම් වැනි ගුණාත්මක සහ ප්‍රමාණාත්මක ඇගයීම් ක්‍රම භාවිතා කිරීම.

v. **ප්‍රතිපෝෂණ සහ ඉගෙනුම් යාන්ත්‍රණ (Feedback and Learning Mechanisms):** අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සඳහා ලබාගත් අත්දැකීම්, හොඳම භාවිතයන් සහ පාර්ශවකරුවන්ගේ ප්‍රතිපෝෂණ ග්‍රහණය කර ගැනීමට ප්‍රතිපෝෂණ සහ ඉගෙනුම් යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී ඉගෙනීමේ සහ නවෝත්පාදන සංස්කෘතියක් ඇති කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ දායකත්වය, දැනුම බෙදාහදා ගැනීම සහ සහභාගීත්ව ප්‍රවේශයන් දිරිමත් කිරීම.

vi. **අනුවර්තන කළමනාකරණය සහ නිවැරදි කිරීමේ පියවර (Adaptive Management and Course Correction):** තීරණ ගැනීමට සහ අවශ්‍ය පරිදි ප්‍රතිපත්තිමය මැදිහත්වීම් අනුවර්තනය කිරීමට අධීක්ෂණ සහ ඇගයීම් සොයාගැනීම් භාවිතා කිරීම. ක්‍රියාත්මක කිරීමේදී පවතින බාධා, සීමාවන් සහ අඩුපාඩු හඳුනාගෙන ඒවාට ක්‍රියාකාරීව විසඳුම් සෙවීම සඳහා නිවැරදි කිරීමේ පියවර සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම.

vii. **විනිවිදභාවය සහ වගවීම (Transparency and Accountability):** සොයාගැනීම්, වාර්තා සහ නිර්දේශ අදාළ පාර්ශවකරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ මහජනතාව සමඟ බෙදාහදා ගැනීමෙන් අධීක්ෂණ සහ ඇගයීම් ක්‍රියාවලියේ විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම. විවෘත සංවාද, ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයන් සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අදාළ දුක්ගැනවිලි හෝ පැමිණිලි විසඳීම සඳහා වන යාන්ත්‍රණයන් ප්‍රවර්ධනය කිරීම.

viii. **ධාරිතා වර්ධනය (Capacity Building):** රාජ්‍ය ආයතන, නියාමන ආයතන සහ අනෙකුත් අදාළ පාර්ශවකරුවන් තුළ අධීක්ෂණය සහ ඇගයීම සඳහා වන ආයතනික සහ මානව ධාරිතාව ගොඩනැගීම. දත්ත එකතු කිරීම, විශ්ලේෂණය සහ වාර්තා කිරීමේ හැකියාවන් නැංවීමට සහ සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීමේ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සඳහා පුහුණුව, තාක්ෂණික සහාය සහ සම්පත් ලබා දීම.

ix. **ප්‍රතිපත්ති සමාලෝචනය සහ සැලසුම්කරණය සමඟ ඒකාබද්ධ කිරීම (Integration with Policy Review and Planning):** සොයාගැනීම් මඟින් ප්‍රතිපත්ති සම්පාදනය, සංශෝධනය සහ ප්‍රමුඛතා සැකසීම සඳහා තොරතුරු සැපයෙන බව සහතික කරනු වස් අධීක්ෂණ සහ ඇගයීම් ක්‍රියාකාරකම් ප්‍රතිපත්ති සමාලෝචන සහ සැලසුම් ක්‍රියාවලීන් සමඟ ඒකාබද්ධ කිරීම. නැගී එන අවශ්‍යතා සහ ප්‍රමුඛතා මත පදනම්ව නව අරමුණු සැකසීමට, උපාය මාර්ග ගැලපීමට සහ සම්පත් නැවත වෙන් කිරීමට M&E ප්‍රතිඵල භාවිතා කිරීම.

ශක්තිමත් අධීක්ෂණ සහ ඇගයීම් යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීමෙන්, ශ්‍රී ලංකාව සිය සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී වගවීම, විනිවිදභාවය සහ ඵලදායීතාව ඉහළ නැංවීමටත්, ප්‍රතිපත්තිමය මැදිහත්වීම්වල බලපෑම උපරිම කිරීමටත්, සමුද්‍රීය ක්ෂේත්‍රය තුළ තිරසාර සංවර්ධන ප්‍රතිඵල ළඟා කර ගැනීමටත් අපේක්ෂා කරයි.

## 9. පාරිභාෂික ශබ්දමාලාව (Glossary)

I. **සමුද්‍රීය ප්‍රවාහන ප්‍රතිපත්තිය (Maritime Transport Policy):** සමුද්‍රීය වෙළඳාම, ප්‍රවාහනය, සුරක්ෂිතතාව සහ පාරිසරික ආරක්ෂාව ඇතුළත් රටක සමුද්‍රීය කටයුතු පාලනය කරන පුළුල් ප්‍රතිපත්ති, අරමුණු සහ උපාය මාර්ග සමුදායකි.

II. **වරාය යටිතල පහසුකම් (Port Infrastructure):** භාණ්ඩ හා මගීන් පැටවීම, බෑම සහ ගබඩා කිරීම සඳහා භාවිතා කරන වරායන් තුළ ඇති නැංගුරම් පොළවල් (Berths), පර්යන්ත (Terminals), ගබඩා (Warehouses), දොඹකර (Cranes) සහ නාවික ගමනාගමන නාලිකා (Navigation channels) ඇතුළු භෞතික පහසුකම් සහ ව්‍යුහයන් වේ.

III. **වෙළඳ පහසුකම් සැලසීම (Trade Facilitation):** වෙළඳ පිරිවැය අඩු කිරීම සහ වෙළඳ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා දේශසීමා හරහා භාණ්ඩ, සේවා සහ තොරතුරු ගලායාම සරල කිරීම, එකඟතාවයකට පත් කිරීම සහ කඩිනම් කිරීම අරමුණු කරගත් පියවර සහ ක්‍රියාවලීන් වේ.

IV. **සමුද්‍රීය සුරක්ෂිතතාව (Maritime Security):** නිරීක්ෂණ, නීතිය ක්‍රියාත්මක කිරීම සහ නියාමන පියවරයන් හරහා මුහුදු කොල්ලකෑම්, ත්‍රස්තවාදය, ජාවාරම් සහ සමුද්‍රීය අපරාධ වැනි තර්ජනවලින් සමුද්‍රීය ක්‍රියාකාරකම්, වත්කම් සහ අවශ්‍යතා ආරක්ෂා කිරීමයි.

V. **පාරිසරික තිරසාරභාවය (Environmental Sustainability):** පරිසර පද්ධති සංරක්ෂණය, දූෂණය අවම කිරීම සහ දේශගුණික විපර්යාස බලපෑම් අවම කිරීම ඇතුළුව, අනාගත පරපුරට ඔවුන්ගේම අවශ්‍යතා සපුරා ගැනීමට ඇති හැකියාවට හානියක් නොවන පරිදි වත්මන් අවශ්‍යතා සපුරාලන අයුරින් ස්වභාවික සම්පත් භාවිත කිරීමේ පුරුද්දයි.

VI. **ජාත්‍යන්තර සහයෝගීතාව (International Collaboration):** සමුද්‍රීය ක්ෂේත්‍රය තුළ පොදු අභියෝගවලට මුහුණ දීමට, සම්පත් බෙදාහදා ගැනීමට සහ අන්‍යෝන්‍ය අවශ්‍යතා ප්‍රවර්ධනය කිරීමට රටවල්, සංවිධාන සහ පාර්ශවකරුවන් අතර පවතින සහයෝගීතාව සහ හවුල්කාරිත්වයයි.

VII. **නියාමන රාමුව (Regulatory Framework):** බලපත්‍ර ලබාදීම, අවසර පත්‍ර, ආරක්ෂක රෙගුලාසි, පාරිසරික රෙගුලාසි සහ රේගු ක්‍රියා පටිපාටි ඇතුළුව සමුද්‍රීය ක්‍රියාකාරකම් පාලනය කරන නීති, රෙගුලාසි, ප්‍රතිපත්ති සහ ප්‍රමිතීන්ගෙන් යුත් පද්ධතියකි.

VIII. **ධාරිතා වර්ධනය (Capacity Building):** සමුද්‍රීය ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට සහ සමුද්‍රීය ක්ෂේත්‍රයේ අභියෝගවලට මුහුණ දීමට අවශ්‍ය දැනුම, කුසලතා, සම්පත් සහ යටිතල පහසුකම් ඉහළ නැංවීම අරමුණු කරගත් මුලපිරීම් වේ.

IX. **රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය (Public-Private Partnerships - PPPs):** සාමාන්‍යයෙන් අවදානම් බෙදාහදා ගැනීම සහ දිගුකාලීන ගිවිසුම්ගත එකඟතාවන් ඇතුළත්, සමුද්‍රීය යටිතල පහසුකම්, සේවා සහ ආයෝජන සැපයීම සඳහා රාජ්‍ය අංශයේ ආයතන සහ පෞද්ගලික සමාගම් අතර ඇති කර ගන්නා සහයෝගීතා විධිවිධානයන් වේ.

X. **අධීක්ෂණය සහ ඇගයීම (Monitoring and Evaluation - M&E):** සමුද්‍රීය ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති මගින් ඒවායේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී ප්‍රගතිය නිරීක්ෂණය කිරීම, කාර්ය සාධනය තක්සේරු කිරීම සහ සක්‍රීය භාවය මැනීම සඳහා වන ක්‍රමානුකූල ක්‍රියාවලීන් වේ.

XI. **පාර්ශවකරුවන්ගේ දායකත්වය (Stakeholder Engagement):** සර්වභාගීත්වය (Inclusivity), විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට රාජ්‍ය ආයතන, කර්මාන්ත සංගම්, සිවිල් සංවිධාන සහ ප්‍රාදේශීය ප්‍රජාවන් ඇතුළු විවිධ පාර්ශවකරුවන් සම්බන්ධ කර ගැනීමයි.

XII. **අනුවර්තන කළමනාකරණය (Adaptive Management):** වෙනස් වන තත්ත්වයන්, ප්‍රතිපෝෂණ සහ ඇගයීම් සොයාගැනීම් මත පදනම්ව ගැලපීම්, ඉගෙනීම සහ අනුවර්තනය වීමට ඉඩ සලසන, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා වන නම්‍යශීලී සහ පුනරාවර්තන (Iterative) ප්‍රවේශයකි.

XIII. **විනිවිදභාවය සහ වගවීම (Transparency and Accountability):** තීරණ ගැනීමේ ක්‍රියාවලීන්, සම්පත් වෙන් කිරීම සහ ප්‍රතිඵලයන්හි විවෘතභාවය, අඛණ්ඩතාව සහ වගකීම සහතික කරන, සමුද්‍රීය

ප්‍රතිපත්ති සහ ආයතන කෙරෙහි මහජන විශ්වාසය සහ සුරක්ෂිතතාව වර්ධනය කරන පාලන මූලධර්ම වේ.

XIV. **අන්තර්-ආයතනික සම්බන්ධීකරණය (Interagency Coordination):** පොදු සමුද්‍රීය අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ කාර්යයන් අතිච්ඡාදනය වීම (Duplication) හෝ උනන්දුව පිළිබඳ ගැටුම් (Conflicts of interest) වළක්වා ගැනීම සඳහා ප්‍රතිපත්ති සමපාත කිරීමට, සම්පත් බෙදා ගැනීමට සහ ක්‍රියාවන් සම්බන්ධීකරණය කිරීමට රාජ්‍ය ආයතන සහ පාර්ශවකරුවන් අතර සිදුකරන සහයෝගී ප්‍රයත්නයන් වේ.